# ලංකා :
# තේ පර්යේෂණායතනය

## 1969

වර්ෂය සඳහා

## වාර්ෂික වාර්තාව

### පළමුවන කොටස


එල්. එච්. ප්‍රණාන්දු, බී.එස්.සී., පී.එච්.ඩී. (ලංඩන්)

හා

ආර්. එල්. ද සිල්වා, බී.එස්සී. (ලංකා), පීඑච්.ඩී. (ලංඩන්)

විසින් සම්පාදිතයි



තලවකැලේ සාන්ත කුම්බස්හී

ලංකා තේ පර්යේෂණායතනය මගින් ප්‍රකාශිතයි

1971

# පටුන


| | පිටුව |
|---|---|
| මණ්ඩලය ... ... ... ... ... ... | 1 |
| නිලධාරි නාමලේඛනය ... ... ... ... ... | 3 |
| ලංකා තේ පර්යේෂණායතන මණ්ඩලයේ සතළිස් හතරවන වාර්ෂික වාර්තාව (1969) | 8 |
| 1969 ජනවාරි 9 වෙනිද පැවැති මණ්ඩල රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාව ... | 14 |
| 1969 පෙබරවාරි 11 වෙනි දින පැවැති මණ්ඩල රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාව ... | 17 |
| 1969 අප්‍රියෙල් 30 වෙනිද පැවැති මණ්ඩල රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාව ... | 19 |
| 1969 ජූනි 1 වෙනි දින පැවැති මණ්ඩල රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාව ... | 23 |
| 1969 ජූනි 24 වෙනි දින පැවැති මණ්ඩල විශේෂ රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාව ... | 25 |
| 1969 අගෝස්තු 28 වෙනි දින පැවැති මණ්ඩල රැස්වීමේ වාර්තාව... ... | 27 |
| 1969 ඔක්තෝබර් 22 වෙනි දින පැවැති මණ්ඩල රැස්වීමේ වාර්තාව ... | 34 |
| 1969 දෙසැම්බර් 20 වෙනි දින පැවැති මණ්ඩල රැස්වීමේ වාර්තාව ... | 38 |
| සචිතානන්ද, ෂොක්මන් විජේරත්න සහ සමාගමේ වාර්තාව ... .... | 44 |
| ඔඩිටර් ජෙනරාල්වරයාගේ වාර්තාව ... ... ... ... | 55 |
| ලංකා තේ පර්යේෂණායතන මණ්ඩලයේ සභාපතිවරයා ගේ වාර්තාව ... | 57 |
| 1969 දෙසැම්බර් 31 වෙනි දිනට ශේෂ පත්‍රය ... ... ... | 59 |
| සාන්ත කූම්බස් වතුයාය—කාරක ගිණුම 1969 ... ... ... | 60 |
| සාන්ත ජොයකිම් වතුයාය—කාරක ගිණුම 1969 ... ... ... | 60 |
| 1969 සඳහා අය වැය ගිණුම... ... ... ... ... | 61 |
| 1969 දෙසැම්බර් 31 වෙනි දිනට ආයෝජන ... ... ... | 62 |
| 1969 දෙසැම්බර් 31 වෙනි දිනට තොග පිළිබඳ සාරාංශය ... ... | 63 |
| 1969 දෙසැම්බර් 31 වෙනි දිනට නිලධාරි ණයකරුවෝ ... ... | 63 |
| 1969 දෙසැම්බර් 31 වෙනි දිනට ණයකරුවන් හා ණය ශේෂය ... ... | 64 |
| 1969 දෙසැම්බර් 31 වෙනි දිනට තැන්පතු ... ... ... | 65 |
| 1969 දෙසැම්බර් 31 වෙනි දිනට මුදල් සාරාංශය ... ... ... | 66 |
| 1969 දෙසැම්බර් 31 වෙනි දිනට ණය හිමියෝ ... ... ... | 67 |
| පසුගිය වසර සඳහා ගැලපීම් ... ... ... ... | 68 |
| 1969 සඳහා ස්ථාවර වත්කම් ලේඛනය ... ... ... ... | 70 |

# ලංකා තේ පර්යේෂණායතනය

## 1969 දෙසැම්බර් 31 වෙනි දිනට මණ්ඩලය

---

**සභාපති:** එස්. පත්මනාදන් මහතා

**නිලබල සාමාජිකයෝ**

කෘෂිකර්ම අධ්‍යක්ෂක :
එම්. එස්. පෙරේරා මහතා

ගරු මුදල් ඇමති :
ජී. ඩී. ලෝස් මහතා විසින් නියෝජනය කෙරේ

ලංකා වැවිලිකරු සංගමයේ සභාපති :
බී. වරුසවිතාන මහතා

ලංකා වැවිලිකරු සංගමයේ ඒජංසි අංශයේ සභාපති :
එස්. කේ. ඩී. ජයමාන්න මහතා

ලංකා පහතරට නිෂ්පාදන සංගමයේ සභාපති :
ජී. හෙට්ටිආරච්චි මහතා

තේ පාලක :
සී. පී. වංමුගම මහතා

ලංකා තේ පර්යේෂණායතනයේ අධ්‍යක්ෂක :
ආචාර්ය එල්. එච්. ප්‍රණාන්දු

**පත්කළ සාමාජිකයෝ :**

ලංකා වැවිලිකරු සංගමය මගින් පත් කළ අය :
එස්. පී. වෛතිලිංගම් මහතා
ජී. බී. මිඩ්ල්ටන් මහතා
ජේ. ආර්. සමර්විල් මහතා

ලංකා වැවිලිකරු සංගමයේ ඒජංසි අංශය මගින් පත් කළ අය :
පී. ජේ. සී. ඩරන්ට් මහතා
ජේ. එෆ්. ඒ. පී. පීරිස් මහතා
එම්. බී. හෝස්ෆෝල් මහතා

ලංකා පහතරට නිෂ්පාදකයන්ගේ සංගමය මගින් පත් කළ අය :
එස්. පත්මනාදන් මහතා
ජේ. එල්. ඩී. පීරිස් මහතා
එල්. සී. ද මැල් මහතා

සුළු ඉඩම් හිමියන් නියෝජනය සඳහා ගරු කෘෂිකර්ම ඇමතිතුමා විසින් පත් කළ අය:
ඩී. ඊ. හෙට්ටිආරච්චි මහතා, සාමදාන විනිශ්චයකාර
එම්. රාජේන්ද්‍රම් මහතා, එම්.බී.ඊ.

නියෝජිත මන්ත්‍රී මණ්ඩලය වෙනුවෙන් ගරු කෘෂිකර්ම ඇමතිතුමා විසින් පත් කළ අය :
ඩී. ජේ. රණවීර මහතා, මහජන මන්ත්‍රී

**ලේකම්:** ඩබ්. ඩී. ඒ. ඊ. ඈස්. වනිගසේකර මහතා

# ලංකා ශේ පර්යේෂණායතනය

## නිලධාරි ලේඛනය

(1969 දෙසැම්බර් 31 වෙනි දිනට)

---

### අධ්‍යක්ෂක මණ්ඩලය

අධ්‍යක්ෂක ... ... ... එල්. එච්. ප්‍රනාන්දු, බී.එස්.සී., පී.එච්.ඩී. (ලංඩන්)
නියෝජ්‍ය අධ්‍යක්ෂක (පරිපාලන) ... ඩබ්. ඩී. ඒ. ආර්. එස්. වනිගසේකර, බී.ඒ. (ලංකා)

### පර්යේෂණාංශ

**කෘෂිකර්ම රසායන විද්‍යාව**

කෘෂිකර්ම රසායන විද්‍යාඥ ... වී. පී. බවානන්දන්, බී.එස්.සී. (ලංකා), පී. එච්.ඩී. (එඩිං), ඒ.ආර්.අයි.සී.

පර්යේෂණ සහයක ... ... *එස්. සිවසුබ්‍රමානියම්, බී.එස්.සී. (ලංකා), ඩී.අයි. සී., ඒ.ආර්.අයි.සී.

කර්මාන්තඥ සහයකයෝ ... වී. ප්‍රනාන්දු
ටී. සී. ඉසෙඩ් ජේමන්
ටී. කුලරත්න, බී.එස්.සී. (ලංකා)
එස්. සුන්දරලිංගම්, බී.එස්.සී. (පූනා)
ඒ. බී. ඩී. පී. වික්‍රමරත්න, බී.එස්.සී. (විද්‍යෝදය)

**ශස්‍ය විද්‍යාව**

පර්යේෂණ නිලධාරි ... ඩබ්. එම්. ඩබ්. බී. මනිපුර, බී.එස්.සී. (ලංකා), පී.එච්.ඩී. (ඔක්ස්ෆඩ්)

පර්යේෂණ සහයක ... ... *එස්. සන්දනම්, බී.එස්.සී. (ලංකා)

කර්මාන්තඥ සහයකයෝ ... එස්. ජී. ජයසූරිය
සී. සී. රාජසිංහම්
ඒ. සෝමරත්න, බී.එස්.සී. (ලංකා)

**ජෛව රසායන විද්‍යාව**

ජෛව රසායන විද්‍යාඥ ... *ආර්. එල්. වික්‍රමසිංහ, බී.එස්.සී. (ලංකා), බී. එස්.සී. (ලංඩන්), පී.එච්.ඩී. (ෂෙෆීල්ඩ්), එෆ්.ආර්.අයි.සී.

පර්යේෂණ නිලධාරීහු ... ජී. ආර්. රොබට්ස්, බී.එස්.සී. (ලංකා), පී.එච්.ඩී. (ලංඩන්), ඩී.අයි.සී., ඒ.ආර්.අයි.සී.

ආර්. ආර්. සෙල්වෙන්ද්‍රන්, බී.එස්.සී. (ලංකා), පී.එච්.ඩී. (ඔක්ස්ෆඩ්)

කර්මාන්තඥ සහයකයෝ ... බී. පී. එම්. පෙරේරා
කේ. සිවපාලන්, බී.එස්.සී. (ලංකා), එම්.එස්.සී. (නවදිල්ලි)

---

*එකෙර පුහුණුව.

කෘෂි විද්‍යාව

කෘෂි විද්‍යාඥ ... ... ඩබ්. දන්තනාරායන, බී.එස්.සී. (ලංකා), පී.එච්. ඩී. (ලංඩන්), ඩී.අයි.සී.

කර්මාන්තඥ සහයකයෝ ... කේ. ඩී. බන්දුලරත්න, බී.එස්.සී. (ලංකා)
එස්. එන්. ප්‍රණාන්දු, බී.එස්.සී. (ලංකා)
සී. ෂන්මුගම්
ඩී. සී. වේරගල

නෙමැටෝඩ විද්‍යාව

නෙමටෝඩ විද්‍යාඥ ... පී. සිවපාලන්, බී.එස්.සී. (ලංකා), පී.එච්.ඩී. (රට්ගර්ස්)

කර්මාන්තඥ සහයකයෝ ... ඒ. ටී. එදිරවීරසිංහම්
ඩී. ජේ. එස්. ජයතිලක
ටී. මනිවාසගර්
එස්. සමරජීව
වී. ශිවානන්දරාජා, බී.එස්.සී. (ලංකා)

ශාක ව්‍යාධි වේදය

ශාක ව්‍යාධි වේදී ... ... එන්. ෂන්මුගනාදන්, බී.එස්.සී. (ලංකා), පී.එච්. ඩී. (ලංඩන්)

පර්යේෂණ නිලධාරි ... ... ආර්. එල්. ද සිල්වා, බී.එස්.සී. (ලංකා), පී.එච්.ඩී. (ලංඩන්), ඩී.අයි.සී.

කර්මාන්තඥ සහයකයෝ ... පී. වී. අරුල්ප්‍රගාසම්, බී.එස්.සී. (මද්‍රාසි), එම්. පිල් (ලංඩන්)
ආර්. එන්. බෝපෙආරච්චි, බී.එස්.සී. (ලංකා)
එස්. ආර්. ඒ. ප්‍රණාන්දු, බී.එස්.සී. (ලංකා)
එස්. මුරුගයියා
ටී. වී. සරම්නපාමන්, බී.එස්.සී. (ලංකා)

ශාක භෞත වේදය

ශාක භෞත වේදී ... ... යූ. පෙතියාගොඩ, බී.එස්.සී. (ලංකා), පී.එච්.ඩී. (ලංඩන්), ඩී.අයි .සී.

පර්යේෂණ නිලධාරීහු ... වී. එස්. කුලසේගරම්, බී.එස්.සී. (ලංකා), පී.එච්.ඩී. (ලංඩන්), එම්.අයි.බයෝ.
ඒ. ආර්. සෙබැස්තියන්පිල්ලෙයි, බී.එස්.සී. (ලංකා), පී.එච්.ඩී. (රෙඩිං)

පර්යේෂණ සහයකයෝ ... *එස්. කන්දයියා, බී.එස්.සී. (ලංකා)
*එස්. නාගරාජා, බී.එස්.සී. (ලංකා), එම්.එස්. (කැලිෆෝනියා

කර්මාන්තඥ සහයකයෝ ... ඒ. එස්. බී. ගෝමස්, බී.එස්.සී. (ලංකා)
ඩී. ජානකිරාම්, බී.එස්.සී. (මද්‍රාසි), එම්.එස්.සී. (නවදිල්ලි)
ඒ. කතිරවෙට්පිල්ලෙයි, බී.එස්.සී. (ලංකා)
එස්. ක්‍රිෂ්ණපිල්ලෙයි, බී.එස්.සී. (ලංකා)
එච්. ආර්. සොලමොන්
එච්. බී. විජේතුංග
එස්. විමලධර්ම

---

*එතෙර පුහුණුව

සංඛ්‍යා ලේඛනඥ ... ... ජී. කනපතිපිල්ලෙයි, බී.එස්.සී. (ලංඩන්), එ/ජ්. එස්.එස්.

කර්මාන්ත ශිල්පාංශය

කර්මාන්ත ශිල්පඥ ... ... ඩී. කීර්තිසිංහ, බී.එස්.සී. (ලංකා), පී.එච්.ඩී. (ලංඩන්), ඩී.අයි.සී., ඒ.එම්.අයි. කෙම්.ඊ.සී. (එංගලන්තය)

පර්යේෂණ සහයකයෝ ... *එන්. එම්. අබ්දුල් ගෆ්ෆීර්, බී.එස්.සී. (ලංකා)
ඩබ්. සී. ඒ. ද සිල්වා, බී.එස්සී. (ලංකා)

කර්මාන්තඥ සහයකයෝ ... ඩබ්. ඒ. සී. ද සිල්වා
එස්. ජයරත්නම්, බී.එස්සී. (ලංකා)
එස්. සමරසිංහම්
ඒ. තේවදසන්, බී.එස්.සී (ලංකා)

විදුලිබල පොර්මන් ... ඩබ්. ආර්. සොලමන්
විදුලි වැඩකරු ... ... කේ. ඒ. බෝව්
යන්ත්‍රකරුවෝ ... ... ඩී. ඒ. එස්. ඕපාත
කේ. එස්. වඩිවේලු

## සාන්ත කුම්බස්

කෘෂිකර්මාන්තඥ ... ... එල්. ඒ. සිවරත්නම්, බී.එස්සී. (ඩුනෙලුම්)
ප්‍රධාන කම්හල් නිලධාරි ... වී. ඒ. පර්නැන්ඩස්
වැඩ බලන මුල් ලිපිකරු ... එච්. එන්. ද සිල්වා
ක්ෂේත්‍ර නිලධාරි ... ... ඩබ්. ආරියපාල
ඇපොතිකරි ... ... එස්. පී. ද සිල්වා
කර්මාන්ත ශාලා ලිපිකරු ... ආර්. ඒ. ඩැනියෙල්
ලිපිකරු (වැඩ) ... ... කේ. එච්. ටී. දසනායක

## පිට පලාත් සේවය

පහත රට සේවය

පහත රට මධ්‍යස්ථානය, රත්නපුර

ජෛව රසායන විද්‍යාඥ ... *ආර්. එල්. වික්‍රමසිංහ, බී.එස්සී. (ලංකා), බී.එස්සී. (ලංඩන්), පීඑච්.ඩී. (ෂෙෆීල්ඩ්), එෆ්.ආර්.අයි.සී.

පර්යේෂණ නිලධාරි (ශස්‍ය විද්‍යා) ඩී. ටී. වෙත්තසිංහ, බී.එස්සී. (ලංකා), පී.එච්.ඩී. (රෙඩිං)

උපදෙස් නිලධාරි ... ... ජේ. වී. සබාරායගම්, බී.එස්.ඒ. (ටොරොන්ටෝ) එම්.එස්.සී. (කැලි)

කර්මාන්තඥ සහයකයෝ ... යූ. එල්. එල්. ද සිල්වා, බී.එස්සී. (ලංඩන්)
ඩබ්. ඒ. බී. ද සිල්වා, බී.එස්සී. (ලංකා)
පී. බී. ඒකනායක

කර්මාන්තඥ සහයකයෝ ... එන්. එල්. සී. ප්‍රණාන්දු, බී.එස්සී. (ලංකා)
සී. කන්දප්පා, බී.එස්සී. (ලංකා)
ඒ. ඒ. සී. කරුණාරත්න, බී.එස්සී. (ලංකා)
ඩී. ඩී. කෘෂන්
කේ. පී. ඩබ්. සී. පෙරේරා, බී.එස්සී. (ලංකා)
එන්. එස්. රාජේන්ද්‍රන්, බී.එස්සී. (මද්‍රාසි)
*ටී. එෆ්. සල්දීන්, බී.එස්සී. (ලංකා)
එච්. එච්. සමරකෝන්
කේ. විනයාගමුදලි

*එතෙර පුහුනුව

| | |
|---|---|
| පරිපාලන නිලධාරි ... | ... සී. කීර්තිරත්න, එෆ්.සී.සී.එස්. |
| ප්‍රධාන ලිපිකරු ... | ... ටී. ආර්. බී. සලේ |
| ලඝුලේඛක ... | ... එස්. කේ. පී. තම්බිමුත්තු |
| ගණක ලිපිකරු ... | ... එම්. බෝවත්ත |
| විදුලි වැඩකරු ... | ... බී. ටී. රණසිංහ |
| ලිපිකරු (වැඩ) ... | ... ටී. ඩී. වී. කුරේ |

## සාන්ත ජෝයකිම්

| | |
|---|---|
| අධිකාරි ... ... | ... ජී. එස්. මුත්තෙට්ටුවේගම |
| කෘෂිකර්මාන්තඥ ... | ... ඊ. ජේ. බී. ද සිල්වා, බී.එස්සී. (ලංකා) |
| ප්‍රධාන කම්හල් නිලධාරි | ... එම්. එස්. ඩබ්. විජේරත්න |
| මුල් ලිපිකරු ... | ... පී. එල්. ඒ. තෝමස් |
| ක්ෂේත්‍ර නිලධාරි ... | ... ඩී. ඩී. පතිනායක |

කොට්ටාව උප ස්ථානය, තල්ගම්පොල

| | |
|---|---|
| කාර්ය භාර නිලධාරි | ... කේ. එච්. ජී. ගුණපාල |
| කර්මාන්තඥ සහයක | ... එස්. ඩී. ධර්මපාල |

දෙනියාය

| | |
|---|---|
| කර්මාන්තඥ සහයක | ... ජේ. අයි. එච්. බණ්ඩාරනායක |

මැද රට සේවය

| | |
|---|---|
| මැද රට විද්‍යා නිලධාරි | ... *ඩී. කාල්නයිදු, බී.එස්සී. (ලංකා), පීඑච්.ඩී. (ලංඩන්) |
| උපදෙස් නිලධාරි ... | ... එම්. කේ. වෛතිලිංගම් |
| කර්මාන්තඥ සහයකයෝ | ... ටී. ඒ. මුණසිංහ<br>එච්. බී. රත්නායක<br>කේ. තිරුඥණසුන්දරම්, බී.එස්සී. (ලංකා) |
| ලිපිකරු/යතුරු ලියන්නා | ... වී. කෝදගොඩ |

ඌව සේවය

| | |
|---|---|
| ඌව විද්‍යා නිලධාරි | ... එල්. එම්. ද ඩබ්. තිලකරත්න, බී.එස්සී. (ලංකා) එම්.ඊඩී. (කැලිෆෝ) |
| කර්මාන්තඥ සහයකයෝ | ... ඒ. එම්. අබේසිංහ<br>ඒ. ආර්. එම්. හෂීම්<br>එච්. ඩී. ජයසිංහ<br>එම්. ටී. සුබ්‍රමනියම්, බී.එස්සී. (ලංකා) |
| ලිපිකරු ... ... | ... ඒ. සී. පෙරේරා |

## උපදෙස් සේවය

| | |
|---|---|
| උපදෙස් නිලධාරීහු ... | ... ආර්. කේ. නැතැනියෙල්, බී.එස්සී. (පූනා)<br>ජේ. වී. සබානායගම්, බී.එස්සී. (ටොරොන්ටෝ), එම්.එස්.සී. (කැලි)<br>එම්. කේ. වෛතිලිංගම් |

*එතෙර පුහුනුව

## පුස්තකාලය හා ප්‍රකාශන

| | |
|---|---|
| ප්‍රකාශන සම්පාදකයෝ ... | එල්. එච්. ප්‍රණාන්දු, බී.එස්සී. පීඑච්.ඩී. (ලංඩන්)<br>එන්. ෂන්මුගනාදන්, බී.එස්සී. (ලංකා), පීඑච්.ඩී. (ලංඩන්) |
| පුස්තකාලයාධිපති ... ... | ඩී. ජේ. එස්. ද සිල්වා, බී.එස්සී. (පංජාබ්) |
| ඡායාරූප ශිල්පී ... ... | ඩී. ජේ. එම්. හෙට්ටිආරච්චි |

## පරිපාලනය

| | |
|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂක (පරිපාලන) | ඩබ්. ඩී. ඒ. ටී. එස්. වනිගසේකර, බී.ඒ. (ලංකා) |
| ගණකාධිකාරි ... ... | එච්. එස්. ගුණවර්ධන, බී.ඒ. (ලංකා) |
| පරිපාලන/ගණක සහයක ... | ආර්. අයි. පෙරෙයිරා |
| ප්‍රධාන ලිපිකරු ... ... | ඩබ්. ජේ. සැමුවෙල් |
| දෙවු ගණක ලිපිකරු ... | එම්. බී. පැලිස් |
| ගණක ලිපිකරුවෝ ... | කේ. ඩී. බී. එච්. අබේගුණවර්ධන<br>එච්. අත්තනායක<br>ජී. ඒ. කේ. පී. ද සිල්වා<br>කේ. පී. ගුණවර්ධන<br>එන්. එම්. ජයතිලක<br>එස්. කුලසබානාදන්<br>එම්. එන්. සේදර<br>යූ. සී. උනම්බුව<br>එච්. සී. වික්‍රමසිංහ |
| අභ්‍යන්තර විගණන ... | වී. ඊස්වරනාදන්, බී.ඒ. (ලංකා) |
| අභ්‍යන්තර විගණන නිලධාරි ... | අයි. රෙන්ගරාජ් |
| අභ්‍යන්තර විගණන ලිපිකරු ... | එන්. සච්තානන්දන් |
| පරිවර්තක/උපදේශක ... | සී. ඇම්. ප්‍රණාන්දු, බී.ඒ. (ලංකා) |
| අධ්‍යක්ෂකගේ ලේකම් ... | ජී. ඒ. එස්. ගුණසිංහ |
| ලඝුලේඛකයෝ ... ... | ජී. කේ. ඒබ්‍රහම්<br>ටී. එෆ්. හලල්දීන්<br>ටී. ඒ. සොලමන්ස්<br>පී. ඩබ්. උඩුවාවෙල<br>එස්. ඩී. ජේ. ජේ. විතාරණපතිරණ |
| ලිපිකරු යතුරු ලියන්නෝ ... | ජේ. එන්. ඇපාසිංහ<br>ඩී. ඩබ්. බර්තොලොමියුස්<br>සී. වී. ආර්. ඩී. පොන්සේකා<br>එස්. බී. වැත්තෑව |
| වාර්තා ලිපිකරු ... ... | කේ. එල්. ද අල්විස් |
| තැපැල් ලිපිකරු ... ... | එච්. ඩබ්. පෙරේරා |
| ගබඩාකරු ... ... | අයි. පී. දිසානායක |

එක්දහස් නවසිය හැටනවය වර්ෂය සඳහා ලංකා තේ පර්යේෂණායතන මණ්ඩලයේ

## හතලිස් සතරවන වාර්ෂික වාර්තාව

### ස්ථාපනය

1925 ඔක්තෝබර් 27 දතම අංක 12 දරණ ආඥා පනතින් ලංකා තේ පර්යේෂණායතනය ස්ථාපනය කරන ලදී.

### ව්‍යවස්ථාව

මණ්ඩලයේ ව්‍යවස්ථාව ලංකා ව්‍යවස්ථා සංග්‍රහයෙහි (1956 සංශෝධනය) 438 වෙනි පරිච්ඡේදයෙහිද පහත සඳහන් තේ පර්යේෂණ (සංශෝධිත) පනත් වලද අඩංගුවේ.

1957 මාර්තු 18 දතම 1957 අංක 8
1959 ජනවාරි 21 දතම 1958 අංක 2
1959 ජනවාරි 21 දතම 1959 අංක 3
1961 ජූනි 19 දතම 1961 අංක 57

සංශෝධිත පනත්වල අංක යෙදීම 1956 සංශෝධිත ලංකා ව්‍යවස්ථා මාලාව හා එකඟ නොවන හෙයින් ඒකාබද්ධ කිරීමක් අවශ්‍යය.

## මණ්ඩලයේ හා කමිටුවල සාමාජිකත්වය

### මණ්ඩලය

ජනවාරි පළමු වන දිනට මණ්ඩලයේ සාමාජිකත්වය

සභාපති                    හිස්

නිලබල සාමාජිකයෝ

කෘෂිකර්ම අධ්‍යක්ෂක
එම්. එස්. පෙරේරා මහතා

ගරු මුදල් ඇමතිතුමා
ජී. ඩී. ලෝස් මහතා විසින් නියෝජනය කෙරේ.

සභාපති, ලංකා වැවිලිකරු සංගමය
බී. වරුසවිතාන මහතා

සභාපති, ලංකා වැවිලිකරු සංගමයේ ඒජංසි අංශය
එස්. කේ. ඩී. ජයමාන්න මහතා

සභාපති, ලංකා පහතරට නිෂ්පාදක සංගමය
ටී. සී. ඒ. ද සොයිසා මහතා

තේ පාලක
සී. පී. වංමුගම් මහතා

අධ්‍යක්ෂක, ලංකා තේ පර්යේෂණායතනය
ආචාර්ය එල්. එච්. ප්‍රණාන්දු

පත්කළ සාමාජිකයෝ

ලංකා වැවිලිකරු සංගමය මගින් පත්කළ අය
එස්. පී. වෛතිලිංගම් මහතා
ජී. බී. මිඩ්ල්ටන් මහතා
ජේ. ආර්. සමර්විල් මහතා

ලංකා වැවිලිකරු සංගමයේ ඒජංසි අංශය මගින් පත්කළ අය
පී. ජේ. සී. ඩරන්ට් මහතා
එම්. බී. හෝස්පෝල් මහතා
ජේ. එෆ්. ඒ. පී. පීරිස් මහතා

ලංකා පහතරට නිෂ්පාදක සංගමය මගින් පත්කළ අය
එස්. පත්මනාදන් මහතා
ජේ. එල්. ඩී. පීරිස් මහතා
ජී. හෙට්ටිආරච්චි මහතා

සුළු ඉඩම් හිමියන් නියෝජනය සඳහා ගරු කෘෂිකර්ම ඇමතිතුමා පත්කළ අය
ඩී. ඊ. හෙට්ටිආරච්චි මහතා, ජේ.පී.යූ.එම්.
එම්. රාජේන්ද්‍රම් මහතා, එම්.බී.ඊ., ජේ.පී.

නියෝජිත මන්ත්‍රී මණ්ඩලය වෙනුවෙන් ගරු ආහාර ඇමතිතුමා විසින් පත්කළ අය
මහජන මන්ත්‍රී ඩී. ජේ. රණවීර මහතා

| | | |
|---|---|---|
| වැඩබලන ලේකම් | ... | පී. කනපතිපිල්ලෙයි |
| නීතිපතිහු | ... | ජූලියස් සහ ක්‍රිසි සමාගම |
| විගණකවරු | ... | සීමාසහිත ෆෝඩ්, රෝඩ්ස්, තෝන්ටන් සහ සමාගම් |

මණ්ඩලයේ සාමාජිකත්වය පිළිබඳ පහත දැක්වෙන වෙනස්වීම් වාර්තා කෙරිණි.

එස්. පත්මනාදන් මහතා, 69.4.30 සිට එෆ්. අමරසූරිය මහතා වෙනුවට සභාපති වශයෙන් පත්විය.

ජී. හෙට්ටිආරච්චි මහතා 69.3.31 සිට ටී. සී. ඒ. ද සොයිසා මහතා වෙනුවට පත්විය.

ජේ. බී. එන්. බැංක්ස් මහතා 69.11.5 සිට එම්. බී. හෝස්පෝල් මහතා වෙනුවට පත්විය.

69.3.1 සිට වැඩබලන ලේකම් පී. කනපතිපිල්ලේ මහතා වෙනුවට ඊ. වනිගසේකර මහතා පත් විය.

**රැස්වීම්**

ජනවාරි 9, පෙබරවාරි 11, අප්‍රියෙල් 30, ජූනි 1, ජූනි 26, ජූලි 24, අගෝස්තු 28, ඔක්තෝබර් 22, සහ දෙසැම්බර් 20 යන දිනයන්හි රැස්වීම් 8 ක් පැවැත්විණි.

**පරිපාලන කමිටුව**

1969 ජනවාරි මස 31 වෙනි දිනට පරිපාලන කමිටුවේ සාමාජිකයෝ

සභාපති — ලංකා තේ පර්යේෂණායතන මණ්ඩලයේ සභාපති හිස්

ලංකා තේ පර්යේෂණායතනයේ අධ්‍යක්ෂක

ආචාර්ය එල්. එච්. ප්‍රණාන්දු

**සාමාජිකයෝ**

සී. පී. චංමුගම්
ජී. ඩී. ලෝස් මහතා
එස්. පත්මනාදන් මහතා
ටී. සී. ඒ. ද සොයිසා මහතා
එම්. බී. හෝස්පෝල් මහතා
එස්. කේ. ඩී. ජයමාන්න මහතා
බී. වරුසවිතාන මහතා

වැඩබලන ලේකම් — ලංකා තේ පර්යේෂණායතන මණ්ඩලයේ ලේකම් පී. කනපතිපිල්ලේ මහතා

කමිටුවේ සාමාජිකත්වය පිළිබඳ පහත සඳහන් —වෙනස්වීම් කෙරිණ:—

69.3.31 වෙනි දින සිට ටී. සී. ඒ. ද සොයිසා මහතා වෙනුවට ජී. හෙට්ටිආරච්චි මහතා පත් විය.

69.4.30 වෙනි දින සිට එෆ්. අමරසූරිය මහතා වෙනුවට ඩී. ඊ. හෙට්ටිආරච්චි මහතා පත් විය.

69.3.1 වෙනි දින සිට පී. කනපතිපිල්ලේ මහතා වෙනුවට ඊ. වනිගසේකර මහතා පත් විය.

**රැස්වීම**

මාර්තු 29, අප්‍රියෙල් 29, මැයි 20, ජූනි 24, අගෝස්තු 10, ඔක්තෝබර් 1, සහ නොවැම්බර් 17 යන දිනයන් හිදී කමිටු රැස්වීම් 7 ක් පැවැත්විය.

## අත්හද බැලීම් සහ වතුයාය කමිටුව

1969 ජනවාරි 1 වෙනි දිනට අත්හද බැලීම් සහ වතුයාය කමිටුවේ සාමාජිකයෝ:

**සභාපති** — ලංකා තේ පර්යේෂණායතනයේ අධ්‍යක්ෂක ආචාර්ය එල්. එච්. ප්‍රණාන්දු

නිලබල සාමාජිකයෝ — ලංකා වැවිලිකරු සංගමයේ සභාපති එස්. කේ. ඩී. ජයමාන්න

ලංකා තේ පර්යේෂණායතනයේ දෙවු කාර්ය මණ්ඩලය

**පත්කළ සාමාජිකයෝ**

ලංකා තේ පර්යේෂණායතන මණ්ඩලය වෙනුවෙන්

එස්. පී. වෛතිලිංගම් මහතා
ජී. බී. මිඩ්ල්ටන් මහතා
ජේ. ආර්. සමර්විල් මහතා

ප්‍රාදේශීය වැවිලිකරු සංගම් වෙනුවෙන්

| | |
|---|---|
| බදුල්ල ... ... ... | සී. එෆ්. බෲක් ස්මිත් මහතා |
| බණ්ඩාරවෙල ... ... ... | ඩී. ආර්. මැක්රායි මහතා |
| දික්ඔය ... ... ... | ඒ. මැකී මහතා |
| දිඹුල ... ... ... | පී. සී. ඉන්ස් මහතා |
| මහනුවර ... ... ... | සී. විජේනායක මහතා |
| කැළණිවැලි ... ... ... | ඒ. අයි. ඊ. ද ක්‍රෙට්සර් මහතා |
| මොරවක කෝරළය ... ... | හිස් |
| නුවරඑළිය ... ... ... | ආර්. කේ. ක්‍රිෂ්ටි මහතා |
| සබරගමුව ... ... ... | එස්. ජේ. සල්ගාදු මහතා |
| දකුණුපලාත ... ... ... | ඩී. ඊ. හෙට්ටිආරච්චි මහතා |

**ලංකා වැවිලිකරු සංගමයේ ඒජංසි අංශයේ නියෝජ්‍යත්වය**
**පී. ජේ. සී. ඩරන්ට් මහතා**
**එස්. ජී. සල්ගාදු මහතා**

**තේ වෙළෙඳ සංගමයේ නියෝජ්‍යත්වය**

**ඒ. විට්ටි මහතා**

**සැපයු/සකපු** **පී. කනපතිපිල්ලෙයි මහතා**

**රැස්වීම**

සැප්තැම්බර් 4 සහ ඔක්තෝබර් 31 යන දිනයන්හි දී වර්ෂය තුල රැස්වීම් දෙකක් පැවැත්විණ.

කමිටුවේ සාමාජිකත්වය පිළිබඳ පහත සඳහන් වෙනස්වීම් ඇති විය:—

එස්. පත්මනාදන් මහතා 69.4.30 වෙනි දින සභාපති වශයෙන් පත් විය.

එච්. ජී. ආර්. ද මැල් මහතා වෙනුවට ඩී. බී. එල්. ප්‍රණාන්දු මහතා පත් විය.

මොරවක කෝරළය නියෝජනය සඳහා ජී. අමරසිංහ මහතා වැවිලිකරු සංගමය මගින් පත් කරන ලදි.

ගොඩනැගිලි කමිටුව

1969 ජනවාරි 1 වෙනි දිනට කමිටුවේ සාමාජිකයෝ :

සභාපති ... ... එස්. පී. වෛතිලිංගම් මහතා

සාමාජිකයෝ ... ... ලංකා තේ පර්යේෂණායතන මණ්ඩලයේ සභාපති
හිස්
ලංකා තේ පර්යේෂණායතනයේ අධ්‍යක්ෂක
ආචාර්ය එල්. එච්. ප්‍රණාන්දු
ජී. බී. මිඩ්ල්ටන් මහතා ජේ. එල්. ඩී. පීරිස් මහතා

ලේකම් ... ... ලංකා තේ පර්යේෂණායතන මණ්ඩලයේ ලේකම්
පී. කනපතිපිල්ලෙයි මහතා

වර්ෂය තුල පහත සඳහන් වෙනස්වීම් ඇති විය :—
එස්. පත්මනාදන් මහතා සභාපති වශයෙන් පත් විය.
පී. කනපතිපිල්ලෙයි මහතා වෙනුවට ලේකම් වශයෙන් ඊ. වනිගසේකර මහතා පත්විය.

**රැස්වීම**

වසර තුල කමිටු රැස්වීමක් අප්‍රියෙල් 8 වෙනි දින පැවැත්විණ.

69.8.28 වෙනි දින ගොඩනැගිලි කමිටුව අත්හද බැලීම් සහ වතුයාය කමිටුවේ අනුකාරක සභාව සමග ඒකාබද්ධ කරන ලදි.

<u>තේ පර්යේෂණායතන කනිටු නිලධාරි වෛද්‍ය අරමුදල් භාරකාර මණ්ඩලය</u>

ලංකා තේ පර්යේෂණායතන මණ්ඩලයේ සභාපති
හිස්

තේ පර්යේෂණායතනයේ අධ්‍යක්ෂක
ආචාර්ය එල්. එච්. ප්‍රණාන්දු

තේ පර්.ආ. ප්‍රධාන පරිපාලක නිලධාරී
ජී. කනපතිපිල්ලෙයි මහතා

තේ පර්. ආ. කනිටු නිලධාරීන්ගේ නියෝජිත
ඩබ්ලිව්. ජේ. සැමුවෙල් මහතා

වර්ෂය තුල පහත සඳහන් වෙනස් වීම් ඇති විය.

එස්. පත්මනාදන් මහතා සභාපති වශයෙන් පත් විය.
පී. කනපතිපිල්ලෙයි මහතා වෙනුවට ලේකම් වශයෙන් ඊ. වනිගසේකර මහතා පත්විය.

**රැස්වීම්**

භාර කරුවන්ගේ රැස්වීම් තුනක් ජනවාරි 13, ජූනි 1 සහ ජූලි 9 යන දිනයන්හි පැවැත්විණි.

## තේ පර්යේෂණායතන නිලධාරි අර්ථ සාධක අරමුදල් භාරකරු මණ්ඩලය

තේ පර්යේෂණායතනයේ සභාපති, හිස්, ඩී. ඊ. හෙට්ටිආරච්චි මහතා, එස්. පී. වෛතිලිංගම් මහතා, එම්. කේ. වෛතිලිංගම් මහතා, පී. කනපතිපිල්ලෙයි මහතා, ඩබ්. ජේ. සැමුවෙල් මහතා, සහ ආචාර්ය එල්. එච්. ප්‍රණාන්දු (අධ්‍යක්ෂක තේ. පර්.ආ.) යන අය භාරකරුවෝ වූහ.

වර්ෂය තුල පහත සඳහන් වෙනස් වීම් ඇති විය.

එස්. පත්මනාදන් මහතා සභාපති වශයෙන් පත් විය.
පී. කනපතිපිල්ලෙයි මහතා වෙනුවට ලේකම් වශයෙන් ඊ. වනිගසේකර මහතා පත් විය.

**රැස්වීම්**

භාරකරුවන්ගේ රැස්වීම් දෙකක් ජූනි 1 සහ ජූලි 9 යන දිනවල පැවැත්විණි.

## මුදල්

වර්ෂය තුල ලැබුණු ආදයම රුපි. 4,763,556 ක් විය. මෙය පසුගිය වසරේ ආදයමට වඩා රුපි. 280,619 කින් අඩු විය. තේ සෙස් බද්ද පසුගිය වසර හා සසඳන විට රුපියල් 195,094 කින් අඩු විය. සාන්ත කුම්බ්ස් වතුයායෙන් ලද ලාභය රුපි. 149,395 ක් විය. පසුගිය වසරේ එය රුපි. 282,115. සාන්ත ජොයකිම් වතුයායේ පාඩුව රුපි. 32,553 ක් විය. පසුගිය වසරේ පාඩුව රුපි. 26,152 ක් විය. අනෙක් මාර්ගයන්ගෙන් ලත් ආදයම රුපි. 249,116 කි. පසුගිය වසරේ එය රුපි. 195,518 ක් විය. මෙය සැදුනේ මෙසේය— පොළිය රුපි. 22,938, කඩය හා මස් කඩ කුලිය රුපි. 2,640, අමු තේ කොළ විකිණීමෙන් රුපි. 101,223, ක්ලෝන අතු කැබෙලි විකිණීමෙන් රුපි. 11,748, විවිධ ලැබීම් රුපි. 110,567.

අයභාර වැය රුපි. 3,451,007 දක්වා අඩු විය. පෙර වසරේ එය රුපි. 3,468,153 කි.

ආයතනයේ වත්කම් වල එකතුව රුපි. 3,649,336 ක් විය රජයේ ණය මුදලෙන් ඉතිරි ප්‍රමාණය වූ රුපි. 1,166,665 ඇතුලුව මුළු ණය තුරුස් ප්‍රමාණය රුපි. 1,569,231 ක් විය.

ප්‍රාග්ධන වියදම රුපි. 349,825 ක් විය. පසුගිය වසරේ එය රුපි. 723,912 කි. වියදම් වූ ප්‍රධාන ශීර්ෂයන් මෙසේය :

| | |
|---|---|
| ඉඩම් ... ... ... ... | රුපි. 124,884 |
| ජල සැපයුම ... ... ... ... | 20,351 |
| ගොඩනැගිලි ... ... ... ... | 26,117 |
| ගෘහ භාණ්ඩ හා උපකරණ ... ... | 18,241 |
| විද්‍යාගාර උපකරණ ... ... ... | 106,387 |
| යන්ත්‍රෝපකරණ ... ... ... | 12,525 |
| වාහන ... ... ... ... | 41,320 |

වියදම් වැඩිවීම විශේෂයෙන්ම පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් වාර්තා විණි:

| | | |
|---|---|---|
| කනිටු නිලධාරි පඩි ... ... ... | රු.පි. | 18,151 |
| සුළු සේවක නිලධාරි පඩි ... ... | | 989 |
| විද්‍යාගාර හා කාර්මික ගබඩාව සහ පොදු මෙහෙයුම් වියදම් ... ... ... | | 26,581 |
| පුස්තකාලය සහ ප්‍රකාශන ... ... | | 2,830 |
| පරිපාලනය ... ... ... | | 28,079 |
| ගොඩනැගිලි යන්ත්‍රෝපකරණ නඩත්තුව ... | | 11,979 |
| පොදු ඒකාබද්ධ සේවා ... ... ... | | 115,684 |
| ගමන් ගාස්තු නඩත්තු කිරීම් ආදිය ... ... | | 53,401 |
| පහත රට ස්ථානය ... ... ... | | 55,870 |

පහත සඳහන් අංශයන්හි වියදම් අඩුවීමක් වාර්තා කෙරිණ :

| | | |
|---|---|---|
| දෙවු ශ්‍රේණි වැටුප් ... ... ... | රු.පි. | 216,891 |
| අන්තර් මධ්‍ය ශ්‍රේණි වැටුප් ... ... | | 31,805 |
| විවිධ වැටුප් ... ... ... ... | | 8,864 |
| දිනපතා ගෙවන කම්කරු වැටුප් ... ... | | 57,380 |
| විවිධ ... ... ... ... | | 15,772 |

## නීතිපතිහු

ජූලියස් සහ ක්‍රිසි සමාගම.

## විගණකවරු

ෆෝර්ඩ්, රෝඩ්ස්, තෝන්ටන් සහ සමාගම තවදුරටත් ආයතනයේ විගණකවරුන් වශයෙන් කටයුතු කරයි. 1967 දෙසැම්බර් 31 වෙනි දිනට අවසන් වන වර්ෂය සම්බන්ධයෙන් විගණිත ගිණුම් ප්‍රකාශය හා ශේෂ පත්‍රය මේ සමඟ ඇත.

## ස්තුතිය

තේ කර්මාන්තය හා ඊට අදාල කරුණු සම්බන්ධයෙන් තේ පර්යේෂණායතනයට දෙන ලද සහයෝගය සම්බන්ධයෙන්, ලංඩනයේ ලංකා සංගමයටද, ලංකා වැවිලිකරු සංගමයටද, ලංකා වැවිලිකරු සංගමයේ ඒජංසි අංශයටද, ලංකා පහතරට නිෂ්පාදක සංගමයටද, අනෙක් ආයතන වලටද මණ්ඩලයේ නොවක් ස්තුතිය වාර්තා වේ.

ඩබ්. ඩී. ඒ. ඊ. එස්. වනිගසේකර,
ලේකම්,
ලංකා තේ පර්යේෂණායතන මණ්ඩලය.

## 1969 ජනවාරි මස 9 වෙනි දින පෙ.ව. 9.00 ට කොළඹ පැවැති ලංකා තේ පර්යේෂණායතන මණ්ඩල රැස්වීමේ වාර්තාව

පැමිණි අය: ටී. සී. ඒ. ද සොයිසා, ඩී. ් ී. හෙට්ටිආරච්චි, ජී. හෙට්ටිආරච්චි, එම්. බී. හෝස්පෝල්, එස්. කේ. ඩී. ජයමාන්න, ජී. ඩී. ලෝස්, ජී. බී. මිඩිල්ටන්, එස්. පත්මනාදන්, එම්. එස්. පෙරේරා, ජේ. එල්. ඩී. පීරිස්, ජේ. එෆ්. ඒ. පී. පීරිස්, ඩී. ජේ. රණවීර, ජේ. ආර්. සමර්විල්, එස්. පී. වෛතිලිංගම් යන මහත්වරු හා ආචාර්ය එල්. එච්. ප්‍රණාන්දු (තේ.ප.ආ. අධ්‍යක්ෂක) සහ පී. කනපතිපිල්ලෙයි (වැඩ බලන ලේකම්) යන මහත්වරු.

අධ්‍යක්ෂක ගේ ලේකම්, ජී. ඒ. එස්. ගුණසිංහ මහතා ද පැමිණ සිටියේය.

සී. පී. චංමුගම්, පී. ජේ. සී. ධරන්ට් සහ බී. වරුසවිතාන යන මහත්වරු තමන්ට පැමිණිය නොහැකි බැව් දැන්වූහ.

1. සභාපති වරයකු පත් කිරීම

අධ්‍යක්ෂවරයාගේ ලේකම් රැස්වීමෙන් පිටවිය. එස්. කේ. ඩී. ජයමාන්න මහතා ගේ යෝජනය ජී. බී. මිඩිල්ටන් මහතා ස්ථිර කිරීමෙන් තාවකාලික සභාපති වශයෙන් එම්. එස්. පෙරේරා මහතා පත් කරනු ලැබීය.

2. මණ්ඩලයේ සාමාජිකත්වය

පහත සඳහන් පත්වීම් සභාපති තුමා නිවේදනය කළේය.

1. 68.6.15 වෙනි දින සිට අවුරුදු 3 ක කාලසීමාවක් සඳහා මහජන මන්ත්‍රී ඩී. ජේ. රණවීර මහතා ගරු ආහාර හා කෘෂිකර්ම ඇමති තුමා විසින් පත්කොට ඇති බව.

2. 68.12.19 වෙනි දින සිට එෆ්. අමරසූරිය මහතාගේ අස්වීමෙන් හිස් වූ පුරප්පාඩුවට පහතරට නිෂ්පාදකයන්ගේ සංගමය ජී. හෙට්ටිආරච්චි මහතා පත් කරන ලද බව.

   මණ්ඩලයේ සාමාජිකයන්ට තවදුරටත් කල්පනා කොට බැලීමට කල්දීම සඳහා සභාපති වරයකු තේරීම ලබන රැස්වීම තෙක් කල් තැබිය යුතු යයි තාවකාලික සභාපති වරයා අදහස් කළේය. මණ්ඩලය මෙයට එකඟ විය.

3. 1968 දෙසැම්බර් 15 වෙනි දින පැවැති රැස්වීම් වාර්තාව

ටී. සී. ඒ. ද සොයිසා මහතාගේ යෝජනය, එස්. කේ. ඩී. ජයමාන්න මහතා ස්ථිර කරනු ලැබීමෙන් 1968 දෙසැම්බර් මස 15 වෙනි දින පැවැති මණ්ඩල රැස්වීම් වාර්තාව පිළිගනු ලැබීය.

4. විශේෂ කමිටුවෙහි නිර්දේශ

දෙවු හා අන්තර් මධ්‍ය නිලධාරීන් සම්බන්ධයෙන් විශේෂ කමිටුවෙහි නිර්දේශ සාකච්ඡා කරන ලදී. විශේෂ කමිටුවෙහි සභාපති වශයෙන් ක්‍රියා කළ පත්මනාදන් මහතා කථා කරමින්, කමිටුව විවිධ අවස්ථාවන් හිදී රැස් වූ බවත්, දෙවු ශ්‍රේණි නිලධාරීන් හමු වූ බවත්, ඔවුන්ගේ පෞද්ගලික ලිපිගොනු පරීක්ෂා කළ බවත්, වැඩ බලන අධ්‍යක්ෂක වරයා ද, දෙවු ශ්‍රේණි නිලධාරීන් ද සමඟ සාකච්ඡා කළ බවත් පැවසීය. පසුගිය අවුරුදු ගණනාව තුල කැටි වූ ප්‍රශ්න සියල්ලම විසඳීමට කමිටුවට නොහැකි වුව ද දෙවු ශ්‍රේණි නිලධාරීන් මුහුණ පෑ ප්‍රධාන ප්‍රශ්න විසඳීමට කමිටුව උත්සාහ දරා ඇත. තමන්ගේ කාලයත් ශ්‍රමයත් යෙදීම පිළිබඳව කමිටුවේ අනෙක් සාමාජිකයනට තමා ණයගැති බව ඔහු පැවසීය. ඔහු, අධ්‍යක්ෂක වරයාටත්, වැඩ බලන ප්‍රධාන පරිපාලක නිලධාරි තැනටත් ස්තුති කළේය. කමිටුව සිය කටයුතු අවසන් කොට ඇති අතර වාර්තාව ගරු ඇමති වරයාට ඉදිරිපත් කොට ඇත. මණ්ඩලය කමිටුවේ වාර්තාව අනුමත කරනැයි බලාපොරොත්තු වේ.

(1) ජ්‍යේෂ්ඨත්වය මෙය දැනටමත් මණ්ඩලය අනුමත කොට ඇති බව සටහන් කර ගන්නා ලදී. සමර්විල් මහතාගේ යෝජනයක් අනුව අන්තර් මධ්‍ය හා කනිටු ශ්‍රේණි නිලධාරීන්ගේද ජ්‍යේෂ්ඨත්ව ලේඛනයක් සකස් කිරීමට එකඟ විය.

(2) ප්‍රවාහනය වාහන නිසි ලෙස භාවිතය පිළිබඳ නීතිරීති අධ්‍යක්ෂක වරයා විසින් දැක්විය යුතුයයි සමර්විල් මහතා අදහස් කළේය. දුර පලාත් සඳහා යන ගමන් හැකි තරම් අඩු කළ යුතුය. මණ්ඩලය සමර්විල් මහතාගේ යෝජනයට එකඟ වූ අතර වාහන භාවිතය පිළිබඳ සොයා බලන ලෙසත් ඊලඟ මණ්ඩලයේදී වාර්තා කරන ලෙසත් අධ්‍යක්ෂකවරයා ගෙන් ඉල්ලා සිටිනු ලැබීය.

(3) වැටුප් නිවැරදි කිරීම අන්තර් මධ්‍ය හා කනිටු නිලධාරීන් විසින් කරන ලද ඉල්ලීම් කමිටුවේ පසු රැස්වීම් වලදී සලකා බැලීමට විශේෂ කමිටුව එකඟ විය.

මෙම සංශෝධනයට යටත්ව විශේෂ කමිටුවේ වාර්තාව ඒකමතිකව අනුමත විය. ටී. සී. ඒ. ද සොයිසා මහතා ගේ යෝජනය ජේ. ආර්. සමර්විල් මහතා ස්ථිර කිරීමෙන්, විශේෂ කමිටුව කෙරෙහි ස්තුතිය ප්‍රකාශ කිරීමේ යෝජනයක් ද සම්මත විය.

5. තේ කොමිෂන් වාර්තාව

තේ කොමිෂන් සභාවේ වාර්තාවෙන් උපුටා ගත් කොටස් ද, එම යෝජනා ක්‍රියාත්මක කිරීම පිළිබඳව වූද, 1969 1/3 1 පත්‍රිකාව සාකච්ඡා කරන ලදී.

ශාක ප්‍රචාරණ හා ප්‍රජනන අංශය

ප්‍රජනනය, ප්‍රචාරණය හා භෞත වේදය පිළිබඳ සියලුම කටයුතු ශාක භෞතවේද අංශය යටතේ එක් දෙපාර්තමේන්තුවක් වශයෙන් ගොනු කිරීමට මණ්ඩලය එකඟ විය. ආචාර්ය යූ. පෙතියාගොඩ මහතා ආපසු පැමිණිවිට දෙපාර්තමේන්තුව අලුතින් නම් කිරීම පිළිබඳව තීරණයක් ගනු ඇත. අධ්‍යක්ෂක වරයා සිය සන්දේශයෙහි සඳහන් කර ඇති පරිදි ශස්‍ය විද්‍යාංශය ආචාර්ය වෙත්තසිංහ සහ ආචාර්ය මනිපුර යටතේ පවතිනු ඇත.

කෘෂිමී විද්‍යාංශය

ඇමෙරිකා එක්සත් ජනපදයෙන් ලැබෙන ආධාර යටතේ ගස් ගුල්ලන් මර්ධන කටයුතු වඩාත් විධිමත්ව කර ගෙන යනු ඇත.

සංඛ්‍යාති අංශය

ලැබෙන දතම කොම්පියුටරයක ආධාරයෙන් විශ්ලේෂණය කළ හැකි යැයිද, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ කොම්පියුටරය භාවිතා කිරීම සම්බන්ධයෙන් ඔවුන් සමග සාකච්ඡා කරන ලෙස පීරිස් මහතා කනපතිපිල්ලෙයි මහතා ගෙන් ඉල්ලා සිටියේය.

කර්මාන්ත ශිල්පාංශය

මෙම අංශය රත්නපුරයට ගෙන යැම සම්බන්ධව වූ 1969 1—බී1 දරණ පත්‍රිකාව සාකච්ඡා කරන ලදී.

- තේ නිෂ්පාදනය පිළිබඳ තේ කොමිසමේ නිර්දේශද, කර්මාන්ත ශිල්පාංශයේ හා ජෛව රසායන විද්‍යාංශයේ වැඩ පුණරීක්ෂණය කිරීම, මෙම අංශවල නිලධාරී තත්ත්වය යන කරුණු පිළිබඳව සොයා බැලීමට, පත්මනාදන් මහාතාගේ යෝජනයක් අනුව, ජේ. එෆ්. ඒ. පී. පීරිස් (සභාපති), එස්. පත්මනාදන්, ජී. හෙට්ටිආරච්චි, සී. පී. චංමුගම්, ජේ. එල්. ඩී. පීරිස් සහ ආචාර්ය ඩී. කීර්තිසිංහ (ලේකම්) යන මහතුන් ගෙන් සැදෙන කමිටුවක් පත් කිරීමට තවත් සාකච්ඡා කිරීමෙන් පසුව තීරණය කරන ලදී.

6. වෙනත් කරුණු

(අ) නිලධාරි වෙනස්වීම්

අස්වීම්

1. යූ. පී. ද එස්. වෛද්‍යනාත මහතා, පහතරට ස්ථානයේ කර්මාන්තඥ සහයක 68.10.30.

2. කේ. ඩී. එල්. නානායක්කාර මහතා, පහතරට ස්ථානයේ ගණක ලිපිකරු 68.11.20.

විශ්‍රාම ගැනීම්

අවුරුදු 41 ක සේවයෙන් පසු කෘෂි විද්‍යාංශයේ පර්යේෂණ සහයක ඩී. ජේ. ඩබ්. රණවීර මහතා 69.1.26 වෙනි දින විශ්‍රාම ගත්තේය. අවුරුදු 41 මුළුල්ලේම රණවීර මහතා අසනීප නිවාඩු ගෙන ඇත්තේ සති තුනක් පමණි. රණවීර මහතාගේ සේවය මණ්ඩලය අගය කොට සලකන බව රණවීර මහතාට දැන්වීමට තීරණය විය.

මණ්ඩලයේ මීලඟ රැස්වීම 1969.2.11 වෙනි දින කොළඹ දී පැවැත්වීමට තීරණය විය.

සභාපති තුමාට ස්තුති යෝජනයකින් පසුව, රැස්වීම දිවා 12.00 ට අවසන් විය.

පී. කනපතිපිල්ලෙයි,
වැඩ බලන ලේකම්.

## 1969 පෙබරවාරි මස 11 වෙනි දින පෙ.ව. 9.00 ට කොළඹ පැවැති ලංකා තේ පර්යේෂණායතන මණ්ඩල රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාවයි

පැමිණි අය: සී. පී. වංමුගම්, පී. ජේ. සී. ඩරන්ට්, ටී. සී. ඒ. ද සොයිසා, ඩී. ඊ. හෙට්ටිආරච්චි, එම්. බී. හෝස්ෆෝල්, එස්. කේ. ඩී. ජයමාන්න, ජී. ඩී. ලෝස්, ජී. බී. මිඩ්ල්ටන්, එස්. පත්මනාදන්, එම්. එස්. පෙරේරා, ජේ. එල්. ඩී. පීරිස්, ජේ. එෆ්. ඒ. පී. පීරිස්, එම්. රාජේන්ද්‍රම්, ඩී. ජේ. රණවීර, ජේ. ආර්. සමර්විල්, එස්. පී. වෛතිලිංගම් යන මහත්වරු ද, ආචාර්ය එල්. එච්. ප්‍රණාන්දු (අධ්‍යක්ෂක) සහ පී. කනපතිපිල්ලෙයි (වැඩ බලන ලේකම්) මහතා.

අධ්‍යක්ෂක ගේ ලේකම්, ජී. ඒ. එස්. ගුණසිංහ මහතා ද පැමිණ සිටියේය.

එස්. කේ. ඩී. ජයමාන්න මහතාගේ යෝජනය ජේ. ආර්. සමර්විල් මහතා ස්ථිර කිරීමෙන්, එම්. එස්. පෙරේරා මහතා තාවකාලික සභාපති වශයෙන් පත් කර ගන්නා ලදී.

1. 1969 ජනවාරි මස 9 වෙනි දින පැවැති රැස්වීම

එස්. කේ. ඩී. ජයමාන්න මහතාගේ යෝජනය එස්. පත්මනාදන් මහතා ස්ථිර කිරීමෙන් 1969 ජනවාරි මස 9 වෙනි දින පැවැති රැස්වීම් වාර්තාව සම්මත විය.

අධ්‍යක්ෂක ගේ ලේකම් රැස්වීමෙන් පිටවිය.

2. වාර්තාවෙන් උද්ගතවන කරුණු

(අ) සභාපති වරයකු තේරීම

සභාපති වරයකු පත් කිරීම පිළිබඳව සීමාසහිත ජූලියස් සහ ක්‍රිසි සමාගම විසින් එවන ලද ලිපිය චක්‍රලේඛනය කොට තිබුණි. සභාපති වරයකු පත් කිරීම ඊළඟ රැස්වීම තෙක් කල් තැබීමට තීරණය විය.

(ආ) විශේෂ කමිටුවේ නිර්දේශ

1. ප්‍රකාශන හා ප්‍රචාරක නිලධාරි

ප්‍රකාශන ප්‍රචාරක සහ මහජන සබඳතා පිළිබඳව, පුස්තකාලය සහ ප්‍රකාශන බාර නිලධාරි විසින් ඉදිරිපත් කළ බී 6–11/2/69 දරණ සන්දේශය සාකච්ඡා කරන ලදී. දීර්ඝ සාකච්ඡාවකින් පසුව තේ ත්‍රෛමාසිකය හුදු විද්‍යාත්මක සඟරාවක් වශයෙන් පළ කිරීමටත්, විශ්ව කෝෂයක් පළ කිරීමේ අදහස තව දුරටත් ගෙන යෑමට තීරණය කරන ලදී.

2. නියෝජ්‍ය අධ්‍යක්ෂක (පරිපාලන)

වනිගසේකර මහතා රැස්වීමට කැඳවන ලදී. 1969 මාර්තු 1 වෙනි ද සිට, නියෝජ්‍ය අධ්‍යක්ෂක (පරිපාලන) තනතුර වනිගසේකර මහතාට පැවරීමට මණ්ඩලය තීරණය කර ඇති බව දන්විණ.

68.10.30 වෙනි දින පැවැති අත්හද බැලීම් හා වතුයාය කමිටු රැස්වීම් වාර්තා

1967 වර්ෂය සඳහා නිලධාරීන්ට ප්‍රසාද මුදල් ගෙවීම් පිළිබඳව වූ ඊ.ඊ.එස්.සී. 1–8/1068 දරණ සන්දේශය අධ්‍යක්ෂක වරයා ඉදිරිපත් කළේය. මෙම විෂය සම්බන්ධයෙන් වෘත්තීය සංගම් මගින් නියෝජනයන් ඉදිරිපත් කර ඇතැයි ඔහු පැවසීය. 1966 ත් 1967 ත් දුෂ්කර වර්ෂයන් වූ නිසා 1967 ට මාස දෙකක ප්‍රසාද මුදල් ගෙවීමට තීරණය කරනලදී.

උපදෙස් අංශය.

ව්‍යාප්ති අත්හද බැලීම් 16 කිනම් දේ පිළිබඳව දැයි වංමුගම් මහතා අධ්‍යක්ෂකවරයා ගෙන් විමසීය. මේවා ආචාර්ය වෙනරි විසින් පටන් ගන්නා ලද අත්හද බැලීම් බව අධ්‍යක්ෂක වරයා පැවසීය. මෙම අත්හද බැලීම් දැන් මෙහෙයවනු ලබන්නේ ශස්‍ය විද්‍යා අංශය මගිනි. මේ නිසා මෙම අත්හද බැලීම් වලින් ලැබෙන කරුණු වඩාත් හොඳින් උපයෝගී කර ගත හැකි වේ.

පොහොර යෙදීම පිළිබඳ නිර්දේශ

මෙම නිර්දේශයන් ඉදිරිපත් කිරීමට අත්හද බැලීම් වලින් ලබාගත් සාධකයන් ඇත්දැයි වංමුගම් මහතා විමසීය. මෙම නිර්දේශයන් අත්හද බැලීම් වලින් ලබාගත් ප්‍රතිඵල පදනම් කර ගෙන නිර්දේශ කරනු ලබන බව අධ්‍යක්ෂකවරයා පැවසීය. මේ අනුව අවශ්‍ය පරිදි නමුත් සීමාව නොඉක්මවා පොහොර යොදන ලෙස වතුයාය වලට උපදෙස් දෙනු ලැබේ.

4. වෙනත් කරුණු

(අ) 1968 ඌව ප්‍රදේශයේ නියඟය

ඌව විද්‍යා නිලධාරි විසින් 1968 ඌව ප්‍රදේශයේ නියඟය පිළිබඳව ඉදිරිපත් කළ 1969/8 බී.6 පත්‍රිකාව සාකච්ඡා කරන ලදි. මෙම වාර්තාව පිළිබඳව අගරතැන්න උප ස්ථාන කමිටුව අධ්‍යායනය කොට අධ්‍යක්ෂක වරයාට වාර්තාවක් ඉදිරිපත් කළ යුතු යැයි සමර්විල් මහතා යෝජනා කළේය. මණ්ඩලය එකඟ විය.

(ආ) 1968 තේ පාලන දෙපාර්තමේන්තුවට ගෙවීම්

1968 වර්ෂය සඳහා රුපි. 350,000 ක් තේ පාලන දෙපාර්තමේන්තුවට ගෙවීමට මණ්ඩලය එකඟ විය.

(ඇ) පත්වීම්

1. ඊ. ජේ. බී. ද සිල්වා මහතා, මසකට රු. 435/- ක වැටුපක් මත 69.2.1 දින සිට කෘෂිකර්මාන්තඥ වශයෙන් පත්කරන ලදි.
2. කර්මාන්ත ශිල්පාංශයේ පර්යේෂණ සහයක ඩබ්. සී. ඒ. ද සිල්වා මහතා හොං කොං හී පශ්චාත් උපාධි පුහුණුවෙන් පසු, 69.1.17 වෙනි දින පෙරළා පැමිණ වැඩ භාර ගන්නා ලදි.

(ඈ) ජේ. ආර්. සමර්විල් මහතාගේ නිවාඩු

මැයි/ජූනි මාසවලදී නිවාඩු පිට තමන් දිවයිනෙන් පිටවන බව සමර්විල් මහතා පැවසීය.

සභාපති මහතාට ස්තුති යෝජනයකින් පසුව රැස්වීමේ කටයුතු ප.ව. 12.30 ට කෙළවර විය.

පී. කනපතිපිල්ලෙයි,
වැඩ බලන ලේකම්.

## 1969 අප්‍රියෙල් 30 වෙනි දින පෙ.ව. 9.20 ට කොළඹ පැවැති ලංකා තේ පර්යේෂණායතන මණ්ඩල රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාවයි.

පැමිණි අය: ඩී. ඊ. හෙට්ටිආරච්චි, ජී. හෙට්ටිආරච්චි, එස්. කේ. ඩී. ජයමාන්න, ජී. ඩී. ලෝස්, ජී. බී. මිඩ්ල්ටන්, එස්. පත්මනාදන්, එම්. රාජේන්ද්‍රන්, ජේ. ආර්. සමර්විල්, එස්. පී. වෛතිලිංගම්, සහ ඩබ්. ඩී. ඒ. ඊ. ඇස්. වනිගසේකර යන මහත්වරු.

(වැඩබලන ප්‍රධාන පරිපාලක නිලධාරි) පී. කනපතිපිල්ලෙයි මහතා ද, (අධ්‍යක්ෂක ගේ ලේකම්) ජී. ඒ. එස්. ගුණසිංහ මහතා ද පැමිණ සිටියහ.

සී. පී, වංමුගම්, එල්. සී. ද මැල්, පී. ජේ. සී. ඩරන්ට්, එම්. බී. හෝස්පෝල්, එම්. එස්. පෙරේරා, ජේ. එල්. ඩී. පීරිස්, ජේ. එෆ්. ඒ. පී. පීරිස්, ඩී. ජේ. රණවීර, බී. වරුසවිතාන සහ ආචාර්ය එල්. එච්. ප්‍රණාන්දු (අධ්‍යක්ෂක) යන මහත්වරු තමන්ට පැමිණිය නොහැකි බැව් දන්වූහ.

ජී. හෙට්ටිආරච්චි මහතාගේ යෝජනය එම්. රාජේන්ද්‍රම් මහතා ස්ථිර කිරීමෙන් තාවකාලික සභාපති වශයෙන් ජී. ඩී. ලෝස් මහතා පත් කරගනු ලැබිය.

රැස්වීමේ අනෙක් කටයුතු වලට කලින් සභාපති වරයකු තේරීම නැතහොත් 4 වෙනි කරුණ මුලින් ගැනීමට මණ්ඩලය එකඟ විය.

1. තේ.ප.ආ. මණ්ඩල සභාපති වරයකු පත් කිරීම

ජේ. ආර්. සමර්විල් මහතාගේ යෝජනය ජී. හෙට්ටිආරච්චි මහතා ස්ථිර කිරීමෙන් ලංකා තේ පර්යේෂණායතන මණ්ඩලයේ සභාපති වශයෙන්, එස්. පත්මනාදන් මහතා ඒකච්ඡන්දයෙන් පත්විය.

එස්. කේ. ඩී. ජයමාන්න මහතා මෙවිට රැස්වීමට එකතුවිය. තමා සභාපති වශයෙන් තෝරා ගැනීමෙන් තමන් කෙරෙහි තබන ලද විශ්වාසය පිළිබඳව පත්මනාදන් මහතා මණ්ඩලයට ස්තුති කළේය. තනතුරට සම්බන්ධ වගකීම පිළිබඳව තමන්ට ගැඹුරු අවබෝධයක් ඇතැයි ඔහු පැවසුවේය. මෙම වගකීම දැරීම සඳහා සාමාජිකයන් ගෙන් සහයෝගයත්, උපකාරයත් ලැබෙයැයි තමා බලාපොරොත්තු වන බව ද ඔහු පැවසීය. මණ්ඩලය සතුට පළ කළාය.

2. 1969 පෙබරවාරි මස 11 වෙනි දින පැවැති රැස්වීම් වාර්තා

ඩී. ඊ. හෙට්ටිආරච්චි මහතාගේ යෝජනය ජී. හෙට්ටිආරච්චි මහතා ස්ථිර කිරීමෙන් 1969 පෙබරවාරි මස 11 වෙනි දින පැවැති මණ්ඩල රැස්වීම වාර්තා, සංශෝධනයන්ට යටත්ව සම්මත විය.

3. වාර්තාවෙන් උද්ගත වන කරුණු

මණ්ඩල රැස්වීම් වාර්තා රහසිගත ලේඛන නිසා මණ්ඩලයේ සාමාජිකයන් හා ලේකම් හැර අනෙක් කිසිවකු මේවා තමන් ළඟ තබා ගැනීම වරදක් බව ස්ථාවර නියෝගයක් වශයෙන් කාර්ය සංග්‍රහයෙහි ඇතුලත් විය යුතුයැයි ජයමාන්න මහතා අදහස් කළේය. මණ්ඩලය එකඟ වූවාය.

තේ කොමිසන් වාර්තාව

(අ) ප්‍රකාශන හා ප්‍රචාරක නිලධාරී—මෙම කරුණු පිළිබඳව විශ්ව විද්‍යාලයට ලිවීමටත්, විද්‍යා විෂයන් සහිතව අධ්‍යාපන ඩිප්ලෝමා ලබාගත් උපාධිධරයන් ගේ ලේඛනයක් ලබාගත යුතු බවත් තීරණය විය.

(ආ) වාර්ෂික වාර්තා—දැනට වාර්ෂික වාර්තාව කොටස් දෙකකින් මුද්‍රණය වේ. 1 වෙනි කොටස පරිපාලන වාර්තා ද දෙවැනි කොටස ශිල්පීය ලිපි සඳහා ද වේ. ශේෂ පත්‍රය ද, විගණිත වාර්තාව ද ලබා ගත යුතු නිසා 1 කොටස පළ කිරීමට අවුරුදු 3 ක් පමණ ගත වේ. මෙම ප්‍රමාදය මඟ හරවා ගැනීම සඳහා

ගිණුම් ඇතුලත් කොටස පළමු කොටසෙන් ඉවත් කොට වෙනම ප්‍රකාශනයක් වශයෙන් පල කිරීමට අදහස් කරන ලදී. විගණන වාර්තාව, ගිණුම් ආදිය පළමු කොටසට එකතුකොට එක ප්‍රකාශනයක් වශයෙන්, භාෂා තුනෙන්ම සැසි වාර්තාවක් හැටියට පළකළ හැකිය. මෙම යෝජනයට මණ්ඩලය එකඟ වූ අතර, පිළිවෙතෙහි වෙනස්වීම පිළිබඳව අමාත්‍යාංශයට දැන්විය යුතු බව සඳහන් කර ගැනිණ.

(ඇ) සේවය අත්හිටුවීම—සේවය අත් හිටුවා සිටි, ටී. ජේ. හලල්දීන් මහතා 1969.1.12 දින සිට සේවයෙන් අස්කරන ලද බව සඳහන් කර ගන්නා ලදී.

4. මණ්ඩලයේ සහ කමිටුවල සාමාජිකත්වය

(අ) මණ්ඩලය

1. පහත රට නිෂ්පාදකයන්ගේ සංගමයේ සභාපති වශයෙන්, ජී. හෙට්ටි-ආරච්චි මහතා පත් වීම නිසා ටී. සී. ඒ. ද සොයිසා මහතා වෙනුවට නිලබල සාමාජිකයකු වශයෙන් 69.3.31 වෙනිදින පත්විය.

2. පහත රට නිෂ්පාදකයන්ගේ සංගමය මගින් 69.3.31 වෙනි දින සිට, එල්. සී. ද මැල් මහතා පත් කොට තිබුණි.

3. මණ්ඩලයේ සාමාජිකත්වයෙන් අස් වූ එම්. බී. හෝස්පෝල් මහතා වෙනුවට ලංකා වැවිලිකරු සංගමය ජේ. ඩී. එන්. බැන්ක්ස් මහතා පත්කොට තිබුණි.

(ආ) පරිපාලන කමිටුව

එෆ්. අමරසූරිය මහතා වෙනුවට ඩී. ඊ. හෙට්ටිආරච්චි මහතා පත්කර ගන්නා ලදී.

(ඇ) අත්හදා බැලීම් සහ වතුයාය කමිටුව

මොරවක කෝරළය නියෝජනය සඳහා මොරවක කෝරළ වැවිලිකරු සංගමය මගින් දෙනියාය, ඇනිංකන්ද වතුයායේ, ජී. අමරසිංහ මහතා 69.3.19 සිට පත්කරන ලදී.

සභාපති වරයා මණ්ඩලය වෙනුවෙන් ඉවත්ව යන සාමාජිකයන්ට ස්තුති කළ අතර, නව සාමාජිකයන් පිළිගත්තේය.

5. නිලධාරි කටයුතු

ආචාර්ය එල්. එච්. ප්‍රණාන්දු, අධ්‍යක්ෂක: මෙම තනතුර දැන්වීම් මගින් පල කරද්දී නියමකොට තිබූ වැටුප් පරිමාව වන රු.පි. 2,000—75—2,300 ක වැටුප් පරිමාව අධ්‍යක්ෂක වරයා සඳහා ගරු කෘෂිකර්ම හා ආහාර ඇමති වරයා විසින් අනුමත කොට ඇති බව සභාපති වරයා පැවසීය. මෙය අනුමත කොට ඇත්තේ 1968 ඔක්තෝබර් මාසයේ දී තමා විසින් යෝජනා කරනු ලැබූ වැටුප් පරිමාව වෙනුවටය.

6. 1969 මාර්තු මස 29 වෙනි දින පැවැති පරිපාලන කමිටු රැස්වීම් වාර්තා

මෙම රැස්වීම් වාර්තා පසුගිය දින පැවැති පරිපාලන කමිටුව මගින් සම්මත කරන ලද බවත් සංශෝධන ඇත්නම් ඒවාට ද යටත්ව වාර්තාව සම්මත කළ හැකි බව සභාපති වරයා පැවසීය.

(අ) පරිපාලන අංශය ප්‍රතිසංවිධානය කිරීම

තේ පර්යේෂණායතනයේ පරිපාලන අංශයේ ප්‍රතිසංවිධානයන් පිළිබඳව තම යෝජනාවන් ගැන රොන්සන් මහතා විසින් එවන ලද ලිපියක් ලෝස් මහතා කියැවිය. මේ සම්බන්ධයෙන් දෙන ලද සහය පිළිබඳව ලෝස් මහතාට සභාපතිතුමා ස්තුති කළේය.

(ආ) මුදල්—මෙම අවස්ථාවේ දී ගණකාධිකාරි තැන රැස්වීමට කැඳවන ලදී. වර්ෂයේ ප්‍රථම කාර්තුව සඳහා වූ ගිණුම් ප්‍රකාශය මැයි මස අවසානයට පෙර මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට සූදනම් කළ යුතු බව ගණකාධිකාරි තැනට දන්වන ලදී. මණ්ඩලය වෙත චක්‍රලේඛනය කොට තිබූ විගණිත වාර්තාව පිළිබඳ සාකච්ඡාව ඊළඟ රැස්වීම තෙක් කල් දමන ලදී.

(ඇ) එස්. නාගරාජා මහතා

මාස තුනක දීර්ඝ කිරීමක් දීම පිළිබඳ පරිපාලන කමිටු නිර්දේශය මණ්ඩලය අනුමත කළාය.

එම්. රාජේන්ද්‍රම් මහතාගේ යෝජනය එස්. පී. වෙතිලිංගම් මහතා ස්ථිර කිරීමෙන් 1969 මාර්තු 29 වෙනි දින පැවැති පරිපාලන කමිටු රැස්වීම් වාර්තා සම්මත විය.

69.4.8 වෙනි දින පැවැති ගොඩනැගිලි කමිටු වාර්තා

එම්. රාජේන්ද්‍රම් මහතාගේ යෝජනය ජේ. ආර්. සමර්විල් මහතා ස්ථිර කිරීමෙන් 1969 අප්‍රියෙල් 8 වෙනි දින පැවැති ගොඩනැගිලි කමිටු වාර්තාව සම්මතවිය.

7. වෙනත් කරුණු

(අ) නියෝජ්‍ය අධ්‍යක්ෂක (පරිපාලනය)—මණ්ඩලයේ හා එහි කමිටුවල නීතිවල ද, අර්ථසාධක අරමුදල් සහ කනිටු නිලධාරි වෛද්‍ය අරමුදල් නීතිවල ද, ප්‍රධාන පරිපාලක නිලධාරි යන වචන එන සෑම අවස්ථාවක දීම ඒ වෙනුවට නියෝජ්‍ය අධ්‍යක්ෂක (පරිපාලන) යන වචන යෙදීමට මණ්ඩලය තීරණය කළාය.

(ආ) ඉල්ලා අස්වීම්—ඊ. සී. සී. බ්‍රොහියර් මහතා, ලඝුලේඛක/යතුරු ලියන්නා 69.3.7 සිට.

(ඇ) වැඩ තහනම් කිරීම—69.4.3 දින සිට බලපැවැත්වෙන සේ පහත සඳහන් නිලධාරීන්ගේ වැඩ තහනම් කොට තිබුණි:

එස්. ඒ. එල්. එච්. ප්‍රණාන්දු මහතා, ලඝුලේඛක/යතුරු ලියන්නා.
ඒ. වී. ෆිලික්ස් ජෝන් මහතා, කෘෂි විද්‍යාංශයේ විද්‍යාගාර කාර්ය සහයක.
එස්. ඩී. ජේ. විතාරණපතිරණ මහතා, ලඝුලේඛක/යතුරු ලියන්නා.
සී. බී. වරාවිට මහතා,ගණක ලිපිකරු.

(ඇ) පත්වීම

පී. බී. ඒකනායක මහතා, කර්මාන්තඥ සහයක, පහත රට ස්ථානය, 69.3.12 සිට රුපි 170/- ක මාසික වැටුපක් උඩ.
එම්. බෝවත්ත මහතා, ගණක ලිපිකරු, පහත රට ස්ථානය, 69.3.20 දින සිට රුපි 140/- ක මාසික වැටුපක් පිට.
එස්. ඩී. ධර්මපාල මහතා, කර්මාන්තඥ සහයක, කොට්ටාව, උප ස්ථානය, 69.4.1 සිට රුපි 170/- ක මාසික වැටුපක් මත.
එස්. කුමාරගුණරත්නම් මහතා, කර්මාන්තඥ සහයක, පැළෑටි භෞතවේදී අංශය, 69.3.12 සිට රුපි 170/- ක මාසික වැටුපක් පිට.

ඒ. වී. එදිරවීරසිංහම් මහතා, කර්මාන්තඥ සහයක, වටපණුවේදී අංශය, 69.4.1 සිට රුපි 170/- ක මාසික වැටුපක් පිට.
ඩී. ජී. එස්. ජයතිලක මහතා, කර්මාන්තඥ සහයක, වටපණුවේදී අංශය, 69.4.1 සිට රුපි 170/- මාසික වැටුපක් පිට.
ඩී. සී. වේරගල මහතා, කර්මාන්තඥ සහයක, කෘෂි විද්‍යා අංශය, 69.4.1 සිට රුපි 170/- ක මාසික වැටුපක් පිට.
එස්. එම්. එම්. ආර්. ඥණදර්ශන මහතා, විද්‍යාගාර කාර්ය සහයක, පැළෑටි ව්‍යාධි වේදංශය, 69.3.7 සිට රුපි 60/- ක මාසික වැටුපක් පිට.

(ඉ) අධ්‍යයන නිවාඩු සහ පුහුණුවෙන් පසු පෙරළා පැමිණීම

ආචාර්ය යූ. පෙතියාගොඩ පැළෑටි භෞතවේදී 69.3.5 දින අධ්‍යයන නිවාඩුවෙන් පසු පෙරළා පැමිණියේය.

ඒ. ආර්. සෙබැස්තියන්පිල්ලෙයි මහතා, පර්යේෂණ සහයක, පැළෑටි ප්‍රජනනය, 69.4.9 වෙනි දින එංගලන්තයේ පශ්චාත් උපාධි පුහුණුවෙන් පසු පෙරළා පැමිණියේය.

(ඊ) නිෂ්පාදනය පිළිබඳ මණ්ඩල උප කමිටුව

ජේ. එෆ්. ඒ. පී. පීරිස් මහතා විසින් ඉදිරිපත් කළ 1969 අප්‍රියෙල් 19 දතම අංක බී 7-30-4-69 සංදේශය සටහන් කර ගන්නා ලදි. මේ සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට පෙර කමිටුවේ නිර්දේශ ලබා ගත යුතු යැයි අදහස් කෙරිණ.

ඊළඟ රැස්වීම—පරිපාලන කමිටුවේ මීළඟ රැස්වීම 1969 මැයි 20 වෙනි දින කොළඹ දී පැවැත්වීමට ද, මණ්ඩලයේ මීළඟ රැස්වීම 1969 ජූනි මස 1 වෙනි දින කොළඹ දී පැවැත්වීමට ද තීරණය විය.

මුලසුනට ස්තුති යෝජනයකින් පසු රැස්වීම ප.ව. 1.05 ට කෙළවර විය.

ඩබ්. ඩී. ඒ. ඊ. ඇස්. වනිගසේකර,
ලේකම්.

## 1969 ජූනි 1 වෙනි දින පෙ.ව. 9.00 ට කොළඹ පැවැති ලංකා තේ පර්යේෂණායතන මණ්ඩල රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාවයි.

පැමිණි අය—ජේ. ඩී. එන්. බැන්ක්ස්, පී. ජේ. සී. ඩරන්ට්, එල්. සී. ද මැල්, ඩී. ඊ. හෙට්ටිආරච්චි, ජී. හෙට්ටිආරච්චි, එස්. කේ. ඩී. ජයමාන්න, ජී. ඩී. ලෝස්, ජී. බී. මිඩ්ල්ටන්, එස්. පත්මනාදන්, (සභාපති), ජේ. එල්. ඩී. පීරිස්, ජේ. එෆ්. ඒ. පී. පීරිස්, එම්. රාජේන්ද්‍රන්, ඩී. ජේ. රණවීර, ජේ. ආර්. සමර්විල්, එස්. පී. වෛතිලිංගම්, බී. වරුසවිතාන, ආචාර්ය එල්. එච්. ප්‍රුණාන්දු (අධ්‍යක්ෂක) සහ ඊ. වනිගසේකර යන මහත්වරු.

අධ්‍යක්ෂකගේ ලේකම්, ජී. ඒ. එස්. ගුණසිංහ මහතා ද පැමිණ සිටියේය.

1. 69.4.30 වෙනි දින පැවැති රැස්වීම් වාර්තා

ජේ. ආර්. සමර්විල් මහතාගේ යෝජනය, ජී. බී. මිඩ්ල්ටන් මහතා ස්ථිර කිරීමෙන් වාර්තාව සම්මත විය.

2. වාර්තාවෙන් උද්ගතවන කරුණු

(අ) තේ මණ්ඩලය—කලින් තීරණය කරන ලද පරිදි අධ්‍යක්ෂක තුමාද, වරුසවිතාන, ජයමාන්න, ජී. හෙට්ටිආරච්චි යන මහත්වරු ද, තමා ද මැයි 25 වෙනි දින රැස් වූ බවත්, අගමැති වරයා වෙත ඉදිරිපත් කිරීම සඳහා සන්දේශයක් සූදනම් කළ බව ද පැවසීය. සාමාජිකයන්ගේ දැනගැනීම සඳහා සභාපතිවරයා සන්දේශය කියැව්වේය.

(ආ) පරිපාලනය ප්‍රතිසංවිධානය කිරීම—මහ භාණ්ඩාගාරයේ එක්සත් ජාතීන්ගේ උපදේශක රොන්සන් මහතා රැස්වීමට කැඳවන ලදි. සභාපති වරයා මණ්ඩලයට රොන්සන් මහතා හඳුන්වා දුන් අතර, පැමිණීම ගැන ස්තුති කළේය. මෙම අවස්ථාවේ දී රණවීර මහතා රැස්වීමෙන් පිටවිය. තමා ආයතනයට දෙවරක් පැමිණි බවත්, ආයතනයේ පරිපාලන ගිණුම් හා ගබඩා සංවිධානය පිළිබඳ කරුණු විමසූ බවත් තම අවසාන වාර්තාව එවීමට කලින් තව වතාවක් ආයතනයට යැමට අදහස් කරන බවත් රොන්සන් මහතා පැවසීය. මේ පිළිබඳව යම් අදහස් පළ කිරීමට මණ්ඩල සාමාජිකයන් අදහස් කරන්නේ දැයි ඔහු විමසීය. එසේ කලහොත් එම කරුණු පිළිබඳව ද අවසාන වාර්තාවෙහි සඳහන් කළහැකි වේ. අංශ ප්‍රධානීන් සමග ද දෙවු ශ්‍රෙණි නිලධාරීන් සමග ද එක් වෘත්තීය සංගමයක් සමග ද තමා සාකච්ඡා පැවැත් වූ බවද ඔහු පැවැසීය.

(ඇ) මුදල්—ගණකාධිකාරි වරයා මේ අවස්ථාවේදී රැස්වීමට සහභාගි විය. 1967 සඳහා වූ මූලික විගණන වාර්තාව සාකච්ඡාවට භාජනය වූ අතර, පහත සඳහන් ප්‍රශ්ණ නඟන ලදි.

1. පස්සර ඉඩම්—අවුරුදු 99 යේ බද්ද වෙනස් කිරීමට යමක් කළ හැකි දැයි ලෝස් මහතා විමසීය. මෙම කාලය අවසානයේදී තේ පර්යේෂණායතනයට කිසිවක් නොලැබෙන හෙයිනි. මෙම ඉඩම සම්පූර්ණයෙන්ම තේ පර්යේෂණායතනය මිල දී ගත යුතුයැයි අධ්‍යක්ෂක වරයා යෝජනා කළේය. මේ අනුව පියවර ගැනීමට එකඟ විය.

11. අභ්‍යාන්තර විගණනය—අභ්‍යාන්තර විගණන අංශය තවත් තර කිරීමට ක්‍රියා කර ගෙන යන බව අධ්‍යක්ෂක වරයා පැවසීය.

ලෝස් මහතාගේ යෝජනය එල්. සී. ද මැල් මහතා ස්ථිර කිරීමෙන් වසරකට රුපි 200,000 බැගින් ඉතිරි කිරීමේ තැන්පත් ගිණුමක යෙදවීම අනුමත විය.

(ඈ) තරල පත්ල වියලනය—කලාපීය නිෂ්පාදන ආයතනය, ආචාර්ය හෝල් ජූනි 14 වෙනි දින ලංකාවට එවන බව මණ්ඩලයට දන්වන ලදි. ආචාර්ය

හෝල් මහතාගේ සංචාරයෙන් උද්ගතවන කරුණු පිළිබඳව කෙටි වශයෙන් සාකච්ඡා කිරීමට පරිපාලන කමිටු රැස්වීමෙන් පසුව ජූනි 24 වෙනි දින මණ්ඩලය කෙටි කාලයකට රැස්විය යුතු යැයි තීරණය විය.

(ඉ) තේ නිෂ්පාදනය පිළිබඳ මණ්ඩලයේ උප කමිටුව

මෙම උප කමිටුවේ දෙවන රැස්වීම් වාර්තාව පිළිබඳව සාකච්ඡා කරන ලදී. විශ්ව විද්‍යාලය සහ සී.අයි.එස්.අයි.ආර ය වෙත පැවරීමට බලාපොරොත්තු වන ව්‍යාපාර හතර පිළිබඳව උප කමිටුව වෙනුවෙන් මෙම ආයතන සමඟ සාකච්ඡා පැවැත්වීමට ආචාර්ය කීර්තිසිංහයනට බලය පවරන ලදී.

3. මණ්ඩලයේ සහ කමිටුවල සාමාජිකත්වය

සභාපති වරයා බැන්ක්ස් මහතා පිළිගත් අතර කරන ලද සේවයට හෝස්පෝල් මහතාට ස්තුති කළේය.

ජේ. ආර්. සමර්විල් මහතා නිවාඩු පිට සිටින කාලයේ දී ඒ වෙනුවෙන් වැඩ බැලීම සඳහා වැවිලිකරු සංගමය මගින් දෙමෝදර වතු කණ්ඩායමේ ආර්. විජේරත්න මහතා මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කොට ඇති බව සඳහන් කර ගන්නා ලදී.

4. 69.4.29 සහ 69.5.20 යන දින වල පැවැති පරිපාලන කමිටු රැස්වීම් වාර්තා

(අ) 69.4.29 වෙනි දින රැස්වීම—පහත සඳහන් දෑ අවධානයට භාජනය විය.

1. සාන්ත කුම්බ්ස් හී උපදෙස් අංශය භාර නිලධාරිට, මසකට රු. 50/- ක දීමනාවක් ගෙවීම.
2. විද්‍යාගාර ගබඩාව භාර නිලධාරිට මසකට රු. 50/- ක දීමනාවක් ගෙවීම.
3. තේ පාලකටත්, රජයටත් ණය මුදල්වල 1969 යේ වාරකය ගෙවීම සඳහා ස්ථිර තැන්පත්වල රුපි. 200,000 ක් යෙදවීම.
4. අන්තර්මධ්‍ය ශ්‍රේණි තත්ත්වයේ, අභ්‍යාන්තර විගණන වරයකු පත් කිරීම.

වෙතිලිංගම් මහතාගේ යෝජනය සමර්විල් මහතා ස්ථිර කිරීමෙන් 69.4.29 වෙනි දින පැවැති පරිපාලන කමිටු රැස්වීම් වාර්තා සම්මත විය.

(ආ) 69.5.20 වෙනි දින රැස්වීම—මෙම කමිටු රැස්වීම් වාර්තාව එම කමිටු රැස්වීම මගින් පසු දින සම්මත කරවා ගැනීමට යටත්ව මණ්ඩලය පහත සඳහන් කරුණු අනුමත කළාය.

1. ආයතනය ඇතුලත සිටින, රසායන විද්‍යාවෙන් සමත් උපාධි ධරයන් තේ රස බැලීම පිළිබඳ පුහුණු කොට ඔවුන් අතරෙන් හොඳම අපේක්ෂකයා තේ රසාඥ වශයෙන් තෝරා ගැනීම.

2. 69.5.1 දින සිට ආර්. අයි. පෙරෙයිරා මහතා රුපි. 600/- ක වැටුපකට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම.

3. ඩබ්. ජේ. සැමුවෙල් මහතාගේ තනතුරු නාමය ප්‍රධාන ලිපිකරු (ගිණුම්) වෙනුවට, ප්‍රධාන ලිපකරු වශයෙන් වෙනස් කිරීම.

4. පරිපාලන පළමු ශ්‍රේණියට කෙළින්ම බඳවා ගැනීම.

ප.ව. 1.15 ට රැස්වීම කෙළවර විය.

ඩබ්. ඩී. ඒ. ඊ. ඇස්. වනිගසේකර,
ලේකම්.

## 1969 ජුනි මස 24 වෙනි දින පෙ. ව. 11.30 ට කොළඹ පැවති ලංකා තේ පර්යේෂණායතන මණ්ඩල රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාවයි.

පැමිණි අය: ජේ. ඩී. එන්. බැන්ක්ස්, සී. පී. චංමුගම්, ඩී. ඊ. හෙට්ටිආරච්චි, ජී. හෙට්ටිආරච්චි, එස්. කේ. ඩී. ජයමාන්න, ජී. බී. මිඩ්ල්ටන්, එස්. පත්මනාදන් (සභාපති), ජේ. එෆ්. ඒ. පී. පීරිස්, එම්. රාජේන්ද්‍රම්, එස්. පී. වෛතිලිංගම්, බී. වරුසවිතාන, ආර්. විජේරත්න, ආචාර්ය එල්. එච්. ප්‍රණාන්දු (අධ්‍යක්ෂක) සහ ඊ. වනිගසේකර (ලේකම්) යන මහත්වරු.

අධ්‍යක්ෂකගේ ලේකම්, ජී. ඒ. එස්. ගුණසිංහ මහතා ද පැමිණ සිටියේ ය.

ජේ. එල්. ඩී. පීරිස් මහතා තමන්ට පැමිණිය නොහැකි බැව් දන්වීය.

1. 69.6.1 දින පැවැති රැස්වීම් වාර්තා

ජී. බී. මිඩ්ල්ටන් මහතාගේ යෝජනය ජී. හෙට්ටිආරච්චි මහතා ස්ථිර කිරීමෙන් රැස්වීම් වාර්තා සම්මත විය.

ජේ. ආර්. සමරවිල් මහතා වෙනුවෙන් මණ්ඩලයේ වැඩ බැලූ ආර්. විජේරත්න මහතා සභාපති වරයා විසින් පිළිගනු ලැබීය.

2. කලාපීය නිෂ්පාදන ආයතනයේ, ආචාර්ය එෆ්. ජේ. හෝල් මහතාගේ ලංකා සංචාරයේ ප්‍රතිඵල

එංගලන්තයේ කලාපීය නිෂ්පාදන ආයතනයේ සහකාර අධ්‍යක්ෂක ආචාර්ය එෆ්. ජේ. හෝල් මහතා ද, කොළඹ කොමර්ෂල් සමාගමේ ඒ. මැක්නීල් විල්සන් මහතා ද ලංකා තේ පර්යේෂණායතනයේ කර්මාන්ත ශිල්පඥ ආචාර්ය ඩී. කීර්තිසිංහ ද පැමිණ සිටියහ.

සභාපති වරයා ආචාර්ය හෝල් මණ්ඩලයේ සාමාජිකයන් වෙත හඳුන්වා දුන් අතර තරල පත්ල වියලනය පිළිබඳව උපදෙස් දීමට පැමිණීම ගැන කලාපීය නිෂ්පාදන සංගමයට ද හෝල් මහතාට ද ස්තුති කළේය. තරල පත්ල වියලනය මිළ දී ගැනීමට තීරණයක් දීමට ඇක්සියා සමාගම විසින් දී ඇති කාල සීමාව ජුනි 27 වෙනි ද අවසන් වන හෙයින් මෙම වියලනය මිළ දී ගැනීම පිළිබඳව වහාම තීරණයක් ගත යුතුව ඇතැයි හෝල් මහතා පැවසීය. තමාගේ වාර්තාව පිළිබඳව මණ්ඩලයට කථා කරන ලෙස සභාපති වරයා හෝල් මහතාගෙන් ඉල්ලා සිටියේ ය.

මැක්නීල් විල්සන් මහතා මීට කලින් වතාවක පරිපාලන කමිටුවත් සමඟ මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලද බව ද මෙම රැස්වීමේ සාකච්ඡා වලට සහභාගී වීමට ඔහු ද පැමිණ සිටින බව ද සභාපති වරයා පැවසී ය. රැස්වීමට සහභාගී වීම ගැන සභාපති වරයා විල්සන් මහතාට ස්තුති කළේය.

කල් මදිවීම නිසා තමාට සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කළ නොහැකි වීයැයි හෝල් මහතා පැවසී ය. ඉදිරිපත් කර ඇති වාර්තාව සර්ව සම්පූර්ණ වාර්තාවක් නොවේ යැයි ද මෙම කරුණු පිළිබඳ තමාගේ නිර්දේශ සංක්ෂිප්ත වශයෙන් පමණක් මෙහි දක්වා ඇතැයි ඔහු පැවසීය. සාමාජිකයන්ට යම් යම් ප්‍රශ්ණ නැගීමට ඇත්නම් තමා ඒවාට පිළිතුරු සැපයීමට සූදානම් යැයි ද ඔහු පැවැසී ය.

සාකච්ඡාවෙන් පසුව මණ්ඩලය පහත සඳහන් කරුණු වලට එකඟ විය.

1. වියලනය පවුම් 5,000 කට නිශ්චය වශයෙන්ම මිළදී ගන්නා බව දන්වා ඇක්සියා පැන් සමාගමට කේබලයක් යැවීම.

2. මෙම විශ්ලේෂණය පිළිබඳ අත්හද බැලීම් ත්වදුරටත් ගෙන යෑමට ආර්. ඊ. තොම්සන් මහතා යෙදවීමට මණ්ඩලය අදහස් කරන බව ඔහු වෙත දන්වීම.

3. එක්සත් රාජධානියේ ආධාර වැඩ සටහන යටතේ මෙම විශ්ලේෂණය මිලදී ගැනීමටත්, තොම්සන් මහතාගේ සේවය ලබා ගැනීමටත් විදේශ විනිමය ලබා ගැනීමට ආහාර හා කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් විදේශ ආධාර දෙපාර්තමේන්තුවට ලිවීම.

රැස්වීම ප.ව. 12.30 ට කෙළවර විය.

ඩබ්. ඩී. ඒ. ඊ. ඇස්. වනිගසේකර,
ලේකම්.

## 1969 අගෝස්තු මස 28 වෙනි දින පෙ.ව. 9.00 ට
## තලවකැලේ සාන්ත කුම්බ්ස් හි පැවැති ලංකා තේ පර්යේෂණායතන මණ්ඩල
## රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාවයි.

පැමිණි අය:—සී. පී. චංමුගම්, ඩී. ඊ. හෙට්ටිආරච්චි, ජී. හෙට්ටිආරච්චි, එස්. කේ. ඩී. ජයමාන්න, ජී. ඩී. ලෝස්, ජී. බී. මිඩ්ල්ටන්, එස්. පත්මනාදන් (සභාපති), එස්. පී. වෛතිලිංගම්, බී. වරුසවිතාන, ආර්. විජේරත්න, ආචාර්ය එල්. එච්. ප්‍රණාන්දු (අධ්‍යක්ෂක) සහ ඊ. වනිගසේකර (ලේකම්) යන මහත්වරු.

අධ්‍යක්ෂකගේ ලේකම්, ජී. ඒ. එස්. ගුණසිංහ මහතා ද පැමිණ සිටියේය.

ජේ. ඩී. එන්. බැන්ක්ස්, පී. ජේ. සී. ඩරන්ට්, එල්. සී. ද මැල්, එම්. එස්. පෙරේරා, ජේ. එල්. ඩී. පීරිස්, ජේ. එෆ්. ඒ. පී. පීරිස්, එම්. රාජේන්ද්‍රම් සහ ඩී. ජේ. රණවීර යන මහත්වරු තමන්ට නොපැමිණිය හැකි බැව් දන්වූහ.

### 1. 69.6.24 වෙනි දින පැවැති විශේෂ රැස්වීම් වාර්තා

ජී. හෙට්ටිආරච්චි මහතාගේ යෝජනය ඩී. ඊ. හෙට්ටිආරච්චි මහතා ස්ථිර කිරීමෙන් වාර්තාව සම්මත විය.

### 2. වාර්තාවෙන් උද්ගත වන කරුණු

(අ) එෆ්. ජේ. හෝල් මහතා ලංකාවට පැමිණීම

තරල පත්‍ර වියලනය සම්බන්ධයෙන් හෝල් මහතා බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලයට වාර්තා කර ඇතැයි සභාපති මහතා පැවසීය. එක්සත් රාජධානියේ විදේශ සංවර්ධන අමාත්‍යාංශය වියලනය සඳහා ජා.ප.ස.ස. වට ගෙවන අතර මෙම ව්‍යාපාරයේ වැඩ කිරීම සඳහා ඉංජිනේරුවකු වන ජී. එච්. එලිස් මහතා ද ලංකාවට එවනු ඇත. වියලනය සඳහා ගෙවීම බ්‍රිතාන්‍ය රජයේ ණය යටතේ කාර්මික ආධාර හෝ ව්‍යාපාර ආධාර ශීර්ෂ යටතේ කරනු ඇත. මේ සම්බන්ධයෙන් දෙන ලද සහයට බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලයට ස්තුති කළ යුතු යැයි ලෝස් මහතා අදහස් කළේය.

(ආ) ආරක්ෂක පියවර

පරිපාලන කමිටු රැස්වීම් වල දී ටේප් රෙකෝඩරයක් භාවිතා කිරීමට තීරණය විය.

(ඇ) ප්‍රකාශන හා ප්‍රචාරක නිලධාරී

විද්‍යා විෂයන් සහිත අධ්‍යාපන උපාධිය ලත් උපාධිධරයන් වසර අවසානයේ දී පමණ ලබා ගත හැකි බැව් විශ්ව විද්‍යාලයය තමන්ට දන්වා ඇතැයි අධ්‍යක්ෂක වරයා පැවසීය.

(ඈ) තේ මණ්ඩලය

අගමැති තුමා වෙත යවන ලද මණ්ඩලයේ සංදේශය එතුමා විසින් ඇමති අනුකාරක සභාවකට පවරන ලද බව සභාපති වරයා මණ්ඩලයට අනාවරණය කළේය.

(ඉ) ඩබ්. ජෝසප් මහතා

ආයතනය සමග බැඳී ඇති ගිවිසුම අනුව, තේ පර්යේෂණායතනයට ගෙවීමට ඇති ප්‍රමාණය ඔහු විසින් ගෙවීමට කැමැත්ත ප්‍රකාශ කොට ඇති බැව් අධ්‍යක්ෂක වරයා පැවසීය. අධ්‍යක්ෂකගේ ලේකම් වරයා මෙවිට රැස්වීමට ඇතුලු විය.

(ඊ) මත් පර්යේෂණායතනයේ තැපැල් පහසුකම්

සාන්ත කුම්බ්ස් හි උප තැපැල් කාර්යාලයක් සඳහා සුළු සේවක නිවාසයක් ලබා ගත හැකි බැව් අධ්‍යක්ෂක වරයා පැවසීය. මෙම නිවාසය සඳහා රුපි. 25 ක කුලියක් අය කිරීමට මණ්ඩලය තීරණය කළාය. උප තැපැල් පති හෝ පතිනි තේරීමේ දී සාන්ත කුම්බස් නිවැසියන් ගෙන් සුදුස්සකු තෝරා ගත යුතු වේ.

(ළ) මස් කඩය

නුවරඑළියේ බර්තෝලමියුස් පෙරකදෝරු මහතා ගෙන් ලද ලිපියක් ඉදිරිපත් කළේය. දිසානායක මහතා නෙරපීමට උසාවියෙන් ආඥාවක් ගැනීමට අධිකව ප්‍රමාද වීම ගැන මණ්ඩලය කනස්සල්ලට පත් ව ඇති බව ද ඒ සම්බන්ධයෙන් ඉක්මණින් පියවරක් ගත යුතුයැයි ද මණ්ඩලය අදහස් කරන බව දන්වා බර්තෝලොමියුස් මහතාට ලිපියක් යැවීමට තීරණය විය.

අධ්‍යක්ෂකගේ ලේකම් වරයා මෙවිට රැස්වීමෙන් පිටවිය.

(ළු) වතු සේවක සංගමයේ නියෝජනය

වතු සේවක සංගමයෙන් ලද 69.8.23 දතම ලිපියේ අන්තර්ගත කරුණු මණ්ඩලය සඳහන් කර ගත්තාය. වතු සේවක සංගමයෙන් ලද විදුලි පුවතක් ද ඉදිරිපත් කරන ලදී. සාන්ත ජෝයකිම් වතුයායේ නිලධාරීන් මෙම මස 28 වෙනි දින නැවත වැඩට පැමිණි බව අධ්‍යක්ෂක වරයා පැවසීය. ප්‍රසාද මුදල් ගෙවිය යුත්තේ උපයාගත් ලාභ ප්‍රමාණය අනුව විය යුතු යැයි ද, ප්‍රසාද මුදල් ගෙවීම පර්යේෂණායතනයක් පවත්වා ගෙන යෑම හා එකඟ නොවේ යැයි ද පර්යේෂණායතන ලාභ උපයන ආයතන නොවේ යැයි ද ලෝස් මහතා පැවසීය. සාකච්ඡාවෙන් පසු 1967 වර්ෂය සඳහා දෙමාසයක ප්‍රසාද මුදලක් ගෙවීමට සම්මත විය.

අධ්‍යක්ෂකගේ ලේකම් මෙවිට නැවතත් රැස්වීමට සහභාගි විය.

## 3. මණ්ඩලයේ සහ කමිටුවල සාමාජිකත්වය

(අ) 68.2.18 වෙනි දින සේවා කාලය අවසන් වූ ජී. බී. මිඩ්ල්ටන් මහතාගේ සාමාජිකත්වය අවුරුදු තුනකට නැවතත් වැවිලිකරු සංගමය මගින් දීර්ග කරන ලද බව.

(ආ) I. සබරගමුව පලාත නියෝජනය සඳහා සී. ඇස්. ඉලංගකෝන් මහතා වෙනුවට රිල්හේන කණ්ඩායමේ එස්. ජේ. සල්ගාදු මහතා, අත්හදබැලීම් හා වතුයාය කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් සබරගමුව වැවිලිකරු සංගමය මගින් පත් කරන ලද බව.

II. මෙම කමිටුවේ දිඹුල දිස්ත්‍රික්කය නියෝජනය සඳහා 69.4.17 සිට පී. සී. ඉන්ස් මහතා වෙනුවට ලිඳුල විලිකුල්ට්‍රි කණ්ඩායමේ ටී. බී. පෙතියාගොඩ මහතා දිඹුල දිස්ත්‍රික්කයේ වැවිලිකරු සංගමය මගින් පත් කරන ලද බව.

වාර්තා කරනු ලැබීය.

පසුගිය කාලයේ දී කරන ලද සේවාවනට අස්ව යන සාමාජිකයනට මණ්ඩලය වෙනුවෙන් සභාපතිමහතා ස්තුති කළ අතර මෙතෙක් කරන ලද වටිනා සේවය තවදුරටත් ගෙන යෑම සඳහා යලිත් මිඩ්ල්ටන් මහතා මණ්ඩලයට පත්වීම ගැන සිය සතුට ද පල කළේය.

මෙම අවස්ථාවේ දී ගණකාධිකාරී තැන රැස්වීමට කැඳවන ලදී.

## 4. මුදල්

බී8 – බී11, බී13 – බී16 සහ බී21 යන ඇමුණුම් පත්‍ර සාකච්ඡාවට භාජනය විය. 1967 ගිණුම සම්බන්ධයෙන් විගණනවරුන් නඟා ඇති ප්‍රශ්ණ සම්බන්ධයෙන් තමා ද අධ්‍යක්ෂක වරයා ද ගණකාධිකාරී ද මහජන ගිණුම් කමිටුව ඉදිරියේ පෙනී සිටිය බැව් සභාපති වරයා

පැවසීය. තමන් කළ කරුණු පැහැදිලි කිරීම පිළිබඳව මහජන ගිණුම් කමිටුව සෑහීමට පත්විය. 1968 ගිණුම සාකච්ඡා කිරීමට අප්‍රේල් මස පැවැති රැස්වීමේ දී අවස්ථාවක් නොලැබිණ. ඉන් අනතුරුව වැඩියෙන් හා අඩුවෙන් වැය කිරීම පිළිබඳව ගණකාධිකාරී සපයන ලද සටහන් ද ඇතිව මෙම ගිණුම පරිපාලන කමිටුව මගින් සලකා බලන ලදි. මෙම කමිටුවේ අදහස් වාර්තාවේ සඳහන් වේ.

අලුත් විගණන වරුන් වන සච්චිතානන්දන්, ෂොක්මන් සහ විජේරත්න සමාගමේ විගණිතවරු අවුරුද්ද අවසානයේ දී ආයතනයට පැමිණෙන බව ගණකාධිකාරී මණ්ඩලයට දැන්විය. විගණිතවරුන්ගේ වාර්තාව ලැබුණු විගසම, ගණකාධිකාරීගේ අදහස් ද සහිතව එය මණ්ඩලය වෙත බෙදා හැරිය යුතුයැයි ලෝස් මහතා අදහස් කළේය.

මෙම අවස්ථාවේ දී ගණකාධිකාරී රැස්වීමෙන් පිටවිය.

## 5. 69.6.24 සහ 69.8.10 යන දිනවල පැවැති පරිපාලන කමිටු රැස්වීම් වාර්තා

1. 69.6.24 රැස්වීම

(අ) තේ රසාඥ—ආයතනයේ නිලධාරීන් 10 දෙනකු පුහුණුව සඳහා තෝරා ගත් බව අධ්‍යක්ෂක වරයා පැවසීය.

(ආ) දුම්රිය බලපත්‍ර—තේ පර්යේෂණායතනයට බැඳෙන නිලධාරීන් සඳහා තවදුරටත් දුම්රිය බලපත්‍ර නිකුත් කිරීම කළ යුතු යයි පරිපාලන කමිටුවේ තීරණය මණ්ඩලය අනුමත කළාය.

(ඇ) කාර්ය සංග්‍රහය—චක්‍රලේඛන කොට තිබූ සංශෝධිත කාර්ය සංග්‍රහය සටහන් කර ගන්නා ලදි.

(ඈ) ජ්‍යේෂ්ඨතා ලේඛණය—දෙවූ අන්තර්මධ්‍ය හා කනිටු නිලධාරීන්ගේ ජ්‍යේෂ්ඨතා දැක්වෙන ලේඛනය සඳහන් කර ගන්නා ලදි. අන්තර්මධ්‍ය හා කනිටු ශ්‍රේණියට පත් වූ දිනය සිට එම ශ්‍රේණියේ ජ්‍යේෂ්ඨතා ගණන් ගැනෙන බව සඳහන් කර ගන්නා ලදි.

(ඉ) දෙනියාය ඉඩම—රුපි. 8,000/- කට දෙනියායේ ඉඩම මිලදී ගත යුතුයැයි පරිපාලන කමිටුව කර තිබූ යෝජනය මණ්ඩලය අනුමත කළාය.

එස්. පී. වෛතිලිංගම මහතාගේ යෝජනය ඩී. ඊ. හෙට්ටිආරච්චි මහතා ස්ථිර කිරීමෙන් 69.6.24 වෙනි දින පැවැති පරිපාලන කමිටු රැස්වීම් වාර්තා සම්මත විය.

2. 69.8.10 වෙනි දින පැවැති රැස්වීම් වාර්තාව

1. බස් රථයක් හා මෛක්‍රෝ බස් රථයක් මිල දී ගැනීම—ආයතනයේ උවමනාවන් ගැන සලකා බලන කළ ලොකු බස් රථයක් මිල දී ගන්නවාට වඩා කුඩා රථ දෙකක් මිල දී ගැනීම වඩා යෝග්‍ය යැයි ලෝස් මහතා අදහස් කළේය. මෙවැනි කුඩා බස් රථ දෙකක් දුම්රිය පොලට යෑම හා අනෙක් ගමන් සඳහා ද ලං.ග.ම. බස් රථය ධාවනය කළ නොහැකි අවස්ථාවන් හිදී ඒ වෙනුවෙන් ද යෙදිය හැකි වේ. තවදුරටත් සාකච්ඡා කිරීමෙන් පසුව ලොකු ලැන්ඩ් රෝවරය ද ලොකු බස් රථය ද විකිණීමට මණ්ඩලය තීරණය කළාය. මෛක්‍රෝ බස් රථ දෙකක් හෝ ලොකු බස් රථයක් මිල දී ගැනීම පිළිබඳව වහාම විපරම් කරන ලෙස ලේකම් වරයාට නියෝග කරන ලදි.

2. කාර් ණය—පරිපාලන කමිටුවේ පසුගිය රැස්වීමේ දී මෙම කරුණු 1970 ඇස්තමේන්තු සමග සලකා බැලීමට තීරණය විය.

3. ගෝනකැලේ තේ පර්යේෂණායතනය—අතුරු ස්ථානය—ගෝනකැලේ අතුරු ස්ථානය ඇති ඉඩම මිල දී ගැනීම සලකා බැලීම සඳහා ඒ පිළිබඳ සවිස්තර වාර්තාවක් මණ්ඩලයට ඉදිරිපත් කරන ලෙස අධ්‍යක්ෂකවරයාට නියම කරන ලදි.

## තරල පත්‍ර වියලනය

මෙම කරුණ සාකච්ඡා කරන අවස්ථාවේ දී ආචාර්ය කීර්තිසිංහ ද රැස්වීමට සහභාගී විය.

ආචාර්ය කීර්තිසිංහ, ලෝස් මහතා සහ තමා තරල පත්‍ර වියලනය සම්බන්ධ කරුණු පිළිබඳව ආහාර හා කෘෂිකර්ම අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වරයා හමු වී සාකච්ඡා කළ බව සභාපති වරයා මණ්ඩලයට දන්වීය. මණ්ඩලය ඉදිරියේ තබා ඇති ලිපියෙන් ස්ථිර ලේකම්වරයා හා ඇති වූ සාකච්ඡාවේ දී උද්ගත වූ කරුණු පැහැදිලි වේ. ස්ථිර ලේකම් වරයාට යවා ඇති ලිපියේ කරුණු වලට මණ්ඩලය එකඟ වෙතොත් මේ කාරණය සම්-බන්ධයෙන් කොළඹ කොමර්ෂල් සමාගම සමග සාකච්ඡා දැන් ආරම්භ කළ හැකි වේ.

විදේශ විනිමය හා ගුවන් මගින් බඩු ගෙන්වීම පිළිබඳව සාකච්ඡා කිරීමට ගණකාධිකාරි තැන ද රැස්වීමට කැඳවන ලදි. මෙම පර්යේෂණ කාර්යය සඳහා අත්‍යාවශ්‍ය කොටස් ගුවන් මගින් ගෙන්වීම සඳහා අවසර ලබාදීමේ කාර්යය සභාපතිවරයා ද ලෝස් මහතා ද භාර ගත්තේය. මෙම ව්‍යාපාරයට පේටන්ට් ලබා ගැනීම සම්බන්ධයෙන් නෙවිල් කනගරත්න මහතා ඇමතීමට ද තීරණය විය. ඉංදියාවේ ලංකා තානාපතිවරයාගේ මාර්ගයෙන්, ඉංදියාව රොටොවේනය සම්බන්ධයෙන් පේටන්ට් ලබා ගෙන ඇති අන්දම දැන ගැනීමට ද තීරණය විය. මේ කරුණ පිළිබඳ ඉංදියාවේ දී වෙළෙඳ කොමසාරිස් සමග සාකච්ඡා කරන ලෙස ආචාර්ය කීර්තිසිංහ ගෙන් ඉල්ලා සිටිනු ලැබීය.

මුදල්—මෙම කරුණ සාකච්ඡා කරන විට ගණකාධිකාරිවරයා ද රැස්වීමට සහභාගි විය.

විගණිතවරු—ප්‍රධාන කොටස් සතර සහ වෛද්‍ය අරමුදල් සහ අර්ථසාධක අරමුදල් විගණනය සඳහා විගණිතවරුන් විසින් රුපි. 30,000 ක් අය කරන බව ගණකාධිකාරි රැස්වීමට දැන්වීය.

මෙම විගණන ගාස්තු ඉතා අධික බවත් වහාම මේ පිළිබඳ ආහාර හා කෘෂිකර්ම අමාත්‍යාංශයට ලියන ලෙසත් ගණකාධිකාරිට නියෝග කරන ලදි.

පරිපාලන කමිටුව අනුමත කර ඇති පහත දැක්වෙන නව තනතුරු මණ්ඩලය අනුමත කළාය.

ශස්‍ය විද්‍යාංශයට කනිටු කර්මාන්තඥ සහයකයකු
කර්මාන්ත ශිල්පාංශයට කනිටු කර්මාන්තඥ සහයකයකු
විද්‍යා යතුරු සංසදයට කාර්යාල කාර්ය සහයකයකු
කෘෂිකර්ම රසායනාංශයට ක්ෂේත්‍ර කාර්ය සහයකයකු
දෙනියායට විද්‍යාගාර සහ ක්ෂේත්‍ර කාර්ය සහයකයකු
ඌව ස්ථානයට ක්ෂේත්‍ර කාර්ය සහයකයකු

### විශේෂ කමිටුවේ නිර්දේශ

චක්‍රලේඛනය කරන ලද ඒ29-10/8/69 සලකා බලන ලදි. විශේෂ කමිටුවේ නිර්දේශ 69.8.10 වෙනි දින පැවැති පරිපාලන කමිටු රැස්වීමේ දී සම්මත කරන ලද බව සටහන් කර ගන්නා ලදි. මෙම නිර්දේශ මණ්ඩලය අනුමත කළ අතර මේ විෂමතා හැකි හැමවිටම පසුගිය කාලයට බලපාන අන්දමට සකස් කළ යුතුයැයි තීරණය විය. ජී. හෙට්ටිආරච්චි මහතාගේ යෝජනයක් අනුව කර්මාන්තඥ සහයක ශ්‍රේණියට නිල-ධාරීන් පත් කිරීම සඳහා හාඩි කර්මාන්ත ශිල්පායතනයේ දෙ අවුරුදු ඩිප්ලෝමා සහතිකය සුදුසුකමක් වශයෙන් සැලකිය යුතුය, යන්න මණ්ඩලය අනුමත කළාය.

### ද.ක.එ.වැ.ස. යේ 15 වෙනි විද්‍යා සම්මේලනය

මෙම සම්මේලනයට සහභාගිවීම සඳහා ආචාර්ය කීර්තිසිංහ සහ ආචාර්ය වෙත්ත-සිංහ යැවීම මණ්ඩලය අනුමත කළාය. වැවිලිකරු සංගමයේ නියෝජිතයා වශයෙන් ද මණ්ඩලයේ වැවිලිකරු අංශයේ සාමාජිකයකු වශයෙන් ද, බී. වරුසවිතාන මහතා ද මෙම සම්මේලනයට සහභාගි විය යුතුයැයි ද මණ්ඩලය තීරණය කළාය. ඔහුගේ ගමන් ගාස්තු හා යැපීම් දීමනා වලින් අඩක් ආයතනය විසින් දැරිය යුතු අතර අනෙක් කොටස වැවිලි කරු සංගමය මගින් දරනු ඇත.

ආචාර්ය ආර්. එල්. ද සිල්වා—අධිශිෂ්‍යත්වය

ලංකා රජය මාර්ගයෙන් විදේශ ආයතන මගින් ප්‍රදානය කරනු ලබන ශිෂ්‍යත්ව හා අධිශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ දී ලංකා රජයේ ප්‍රතිපත්තියම අනුගමනය කළ යුතුයැයි මණ්ඩලය තීරණය කළාය. ආචාර්ය ආර්. එල්. ද සිල්වා දිවයිනෙන් බැහැරව සිටින කාලයේ දී ආචාර්ය ෂන්මුගනාදන් ප්‍රකාශන හා පුස්තකාලය භාරව සිටිය යුතුයැයි ද මෙම කාලයේ දී ආචාර්ය සිල්වා ට ගෙවූ දීමනාවක්ම ආචාර්ය ෂන්මුගනාදන්ට ද ගෙවිය යුතු යැයි ද මණ්ඩලය තීරණය කළාය.

අතිරේක වේතනාධික—මෙම කරුණ සාකච්ඡා කරන අවධියේ දී ගණකාධිකාරී ද සහභාගි විය. මෙම කරුණ පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ඡා කිරීමෙන් පසුව රජයේ දෙපාර්තමේන්තු ද සංස්ථා වල ද මේ සම්බන්ධයෙන් පවතින තත්ත්වය සොයා බලා සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ගණකාධිකාරිට නියෝග කරන ලදී.

ආයෝජන—මෙම කරුණ සාකච්ඡා කරන විට ගණකාධිකාරි ද සහභාගි විය. සාකච්ඡා කිරීමෙන් පසුව, නැෂනල් සහ ග්‍රින්ලේස් බැංකුවේ හෝ ලංකා ඉතිරි කිරීමේ බැංකුවේ හෝ යන දෙකින් වැඩි වාසි ලැබෙන ස්ථානයෙහි මුදල් ආයෝජනය කිරීමට සභාපතිවරයාටත් අධ්‍යක්ෂක වරයාටත් බලය පවරන ලදී. මෙම ආයෝජනයේ කොන්දේසි පිළිබඳව ලංකා ඉතිරි කිරීමේ බැංකුවට ලියා දනගන්නා ලෙස ගණකාධිකාරීට නියෝග කරන ලදී.

එස්. පී. වෛතිලිංගම් මහතාගේ යෝජනය ඩී. ඊ. හෙට්ටිආරච්චි මහතා ස්ථිර කිරීමෙන්, ලෝස් මහතා අදහස් කළ සංශෝධනයන්ට යටත් ව 1969 අගෝස්තු 10 වෙනි දින පැවැති පරිපාලන කමිටු රැස්වීම් වාර්තා සම්මත විය.

6—නිලධාරී කටයුතු

(අ) අභ්‍යාන්තර විගණන වරයකු පත්කිරීම

1969 නොවැම්බර් 1 වෙනිද සිට රුපි. 645/- ක මාසික වැටුපක් පිට වී. ඊස්වරනාදන් මහතා අන්තර්-මධ්‍ය ශ්‍රේණියට පත් කිරීම මණ්ඩලය අනුමත කළාය.

(ආ) ආචාර්ය ආර්. එල්. වික්‍රමසිංහ—අධිශිෂ්‍යත්වය

කෙම්බ්‍රිජ් හී මැසචූසෙට් කර්මාන්ත ශිල්පායතනයේ වැඩ කිරීමට ආචාර්ය වික්‍රමසිංහයන්ට ෆුල්බ්‍රයිට් අධිශිෂ්‍යත්වයක් ලැබී ඇතැයි අධ්‍යක්ෂක වරයා ප්‍රකාශ කළේය. මෙම කාල සීමාව 1969 නොවැම්බර් මස සිට 1970 සැප්තැම්බර් මාසය දක්වා වේ. ආචාර්ය වික්‍රමසිංහයන්ට අධිශිෂ්‍යත්වය ප්‍රදානය කිරීමට මණ්ඩලය එකඟ විය. ආචාර්ය වික්‍රමසිංහයන්ට අධිශිෂ්‍යත්වය ලබා ගැනීමට උපකාරවීම ගැන ලෝස් මහතාට සභාපති වරයා ස්තුති කළේය.

(ඇ) 24 වන ටොක්ලායි සම්මේලනය 1969 නොවැම්බර් 10 සිට 14 දක්වා

ශාක භෞතවේදී ආචාර්ය යූ. පෙතියාගොඩ ශාක ව්‍යාධිවේදී ආචාර්ය එන්. ෂන්මුගනාදන් සහ කර්මාන්ත ශිල්පාඥ ආචාර්ය ඩී. කීර්තිසිංහ මෙම සම්මේලනයට සහභාගි විය යුතුයැයි වූ අධ්‍යක්ෂක වරයාගේ නිර්දේශය මණ්ඩලය අනුමත කළාය. එම විටම මොවුන් ඇසාම්, දූරාස් සහ ඩාර්ජිලිං හී තේ වතු නැරඹීමට ද යායුතු යැයි ද සම්මත විය.

7. වෙනත් කරුණු

(අ) පකිස්තාන තේ පර්යේෂණායතනයේ පර්යේෂණ සහයකයකු ලංකාවේ පුහුණු කිරීමට ඉල්ලීම

පකිස්තාන තේ පර්යේෂණායතනයේ පර්යේෂණ සහයකයකු ආයතනයේ දී පුහුණු කිරීම සම්බන්ධයෙන් තේ පාලක මාර්ගයෙන් තමන්ට කොළඹ ක්‍රම ඉල්ලුම් පත්‍රයක් ලැබී ඇතැයි අධ්‍යක්ෂක වරයා පැවසීය. ආයතනයේ කෙටි කාලයකට ඔහු පුහුණු කරවීම මණ්ඩලය අනුමත කළාය.

(ආ) ආචාර්ය එෆ්. ආර්. ටබ්ස්

ආචාර්ය ටබ්ස් සඳහා ටෙල්අවි සිට කොළඹටත් – කොළඹ සිට ටෙල්අවි දක්වාත් යැම් ඊම් ගුවන් ගාස්තු ගෙවීමට කලින් මණ්ඩලය තීරණය කර තිබුණු බව අධ්‍යක්ෂක වරයා පැවසීය. 1970 මාර්තු මාසයේ දී එනවා වෙනුවට ජනවාරියේ දී ලංඩනයේ සිට කෙලින්ම පැමිණීම පහසු බැව් ආචාර්ය ටබ්ස් දූන් දන්වා ඇත. මාර්තු මාසයේ දී ඊශ්‍රායලයේ පැවැත්වෙන උද්‍යාන බෝග සම්මේලනය නිසා කටයුතු බහුල හෙයින් මෙලෙස අදහස් කොට ඇත. සාකච්ඡා කිරීමෙන් පසුව කලින් කර ඇති යෝජනය වඩා යෝග්‍ය බවත් මාර්තු මාසයේ පැමිණෙන ලෙස දන්වා ආචාර්ය ටබ්ස් ට ලිපියක් යවන ලෙසත් අධ්‍යක්ෂක වරයාට නියම කරන ලදි.

(ඇ) අත්හද බැලීම් සහ වතුයාය උපකමිටුව ගොඩනැගිලි කමිටුව හා ඒකාබද්ධ කිරීම

ජේ. එල්. ඩී. පීරිස් මහතා හැරෙන්නට ගොඩනැගිලි කමිටුවේ අනෙක් සියලුම සාමාජිකයන් අත්හද බැලීම් සහ වතුයාය කමිටුවේ ද සාමාජිකයන් බව එස්. පී. වෛතිලිංගම් මහතා පැවසීය. එම නිසා කමිටු දෙකම ඒකාබද්ද කළ හැකියැයි ඔහු පැවසීය. මණ්ඩලය මෙම යෝජනාවට එකඟ විය.

(ඈ) මණ්ඩලයේ මුද්‍රාව:—ආචාර්ය ඩී. කාල්නයිදුගේ අධිශිෂ්‍යත්ව ගිවිසුමට 1969 ජූලි මස 12 වෙනි දින සභාපති, අධ්‍යක්ෂක හා එස්. පී. වෛතිලිංගම් මහතා ඉදිරිපිට දී මණ්ඩලයේ මුද්‍රාව තබන ලද බව වාර්තා කරන ලදි.

(ඉ) සාන්ත කුම්බ්ස් හී නව ගොඩනැගිල්ල:—මෙම කරුණ සම්බන්ධයෙන් ගෘහ නිර්මාණ ශිල්පියකුගෙන් විමසන්න දැයි අධ්‍යක්ෂක වරයා විචාලේය. ඊට කලින් රජයේ නීතිගත ඉංජිනේරු සංස්ථාවේ අධ්‍යක්ෂක වරයාගෙන් මේ පිළිබඳව විමසීම වඩා යෝග්‍ය යැයි ලෝස් මහතා අදහස් කළේය. මණ්ඩලය එකඟ විය.

(ඊ) කර්මාන්ත ශිල්පාංශයේ වැඩ බැලීම:—ඉංදියාවේ ටොක්ලායි සම්මේලනයට සහභාගිවීම සඳහා තමන් දිවයිනෙන් බැහැරව සිටින කාලයේ දී කර්මාන්ත ශිල්පාංශයේ වැඩ බැලීම සඳහා එම අංශයේ පර්යේෂණ සහයක ඩබ්. සී. ජේ. ද සිල්වා මහතා පත් කළ යුතු යැයි ආචාර්ය ඩී. කීර්තිසිංහ නිර්දේශ කර තිබේ යැයි අධ්‍යක්ෂක වරයා පැවසීය. සිල්වා මහතා මෙම අංශය භාරව සිටිය යුතු යැයි ද අවශ්‍ය විට අධ්‍යක්ෂක වරයා විමසිය යුතු යැයි ද මණ්ඩලය තීරණය කළාය.

(උ) නිලධාරී වෙනස්වීම්

පත්වීම්—පහත සඳහන් දෑ සටහන් කර ගැනිණ.

ඊ. ඒ. සොලමන්ස් මහතා ලඝුලේඛක/ලිපිකරු/යතුරු ලේඛක, 69.6.1 සිට රු. 180 ක මාසික වැටුපක් උඩ.

කේ. විනයාගමුදලි මහතා පහත රට ස්ථානයේ කර්මාන්තඥ සහයක, 69.5.3 දින සිට රුපි. 170 මාසික වැටුපක් උඩ.

ජී. කේ. ඒබ්‍රහම් මහතා ලඝුලේඛක/ලිපිකරු/යතුරු ලියන්නා, 69.7.1 සිට රු. 280/- ක මාසික වැටුපක් උඩ.

ඉල්ලා අස්වීම්

එස්. කුමාරගුණරත්නම් මහතා කර්මාන්තඥ සහයක, 69.6.30 වෙනි දින සිට.

එස්. එම්. එම්. ආර්. ඥාණදර්ශන මහතා, විද්‍යාගාර සහයක, 69.8.15 දින සිට.

ආර්. මයිල්වාගනම් මහතා, විද්‍යාගාර සහයක, 69.8.15 සිට.

(ඌ) අධිශිෂ්‍යත්වයක් මත පිටත්වීම:—ආචාර්ය ඩී. කාල්නයිදු 69.7.15 වෙනි දින දිවයිනෙන් පිටත්විය.

(එ) විදෙස් පුහුණුවෙන් පසු පෙරළා පැමිණීම:—පී. එච්. ඩී. උපාධිය ලබා ගැනීමෙන් පසු, ආචාර්ය ඒ. ආර්. සෙබැස්තියන්පිල්ලෙයි 69.4.9 වෙනි දින එක්සත් රාජධානියේ සිට පෙරළා පැමිණියේය.

(ඒ) අස්කිරීම:—එස්. ඒ. එල්. එච්. ප්‍රණාන්දු මහතා ලඝුලේඛක/ලිපිකරු/යතුරු ලේඛක, 69.7.26, සිට.

සී. බී. වරාවිට මහතා ගණක ලිපිකරු 69.7.26 සිට.

රැස්වීම ප.ව. 1.35 ට කෙළවර විය.

ඩබ්. ඩී. ඒ. ඊ. ඇස්. වනිගසේකර,
ලේකම්.

## 1969 ඔක්තෝබර් මස 22 වෙනි දින පෙ. ව. 9.00 ට කොළඹ පැවැති ලංකා තේ පර්යේෂණායතන මණ්ඩල රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාවයි

පැමිණි අය

ජේ. ඩී. එන්. බෑංක්ස්, සී. චංමුගම්, එල්. සී. ද මැල්, ඩී. ඊ. හෙට්ටිආරච්චි, ජී. බී. මිඩ්ල්ටන්, එස්. පත්මනාදන් (සභාපති), ජේ. එෆ්. ඒ. පී. පීරිස්, එම්. රාජේන්ද්‍රම්, එස්. පී. වෛතිලිංගම්, බී. වරුසවිතාන, ආර්. විජේරත්න, ආචාර්ය එල්. එච්. ප්‍රණාන්දු (අධ්‍යක්ෂක තේ.ප.ආ.) සහ ඊ. වනිගසේකර යන මහත්වරු.

අධ්‍යක්ෂක ගේ ලේකම් ජී. ඒ. එස්. ගුණසිංහ මහතාද පැමිණ සිටියේය.

එස්. කේ. ඩී. ජයමාන්න සහ ජේ. එල්. ඩී. පීරිස් යන මහත්වරු තමන්ට පැමිණිය නොහැකි බැව් දන්වා තිබුණි.

1—1969.8.28 වෙනි දින පැවැති මණ්ඩල රැස්වීම් වාර්තා :

ඩී. ඊ. හෙට්ටිආරච්චි මහතා ගේ යෝජනය එස්. පී. වෛතිලිංගම් මහතා ස්ථිර කිරීමෙන් වාර්තාව සම්මත විය.

2—වාර්තාවෙන් උද්ගත වන කරුණු:

(අ) තේ මණ්ඩලය: තේ මණ්ඩල පනත මීට කලින් දින පාර්ලිමේන්තුව ඉදිරියේ තබන ලද බැව් සභාපතිවරයා පැවසීය. තේ මණ්ඩලය පත් කිරීමෙන් පසුව ආයතනයේ සියලුම කටයුතු එය මගින් පත් කරනු ලබන කමිටුවක් මගින් සුපරීක්ෂණය කරනු ඇත. තමන්ගේ නියෝජනයන් දැන් ඉදිරිපත් කරන ලෙස නිලධාරීන්ගෙන් ඉල්ලා සිටීමට මණ්ඩලය තීරණය කළාය.

(ආ) පරිපාලනය ප්‍රතිසංවිධානය කිරීම: මෙම කරුණ සාකච්ඡා කරන විට ගණකාධිකාරී තැනද සහභාගි විය.

69.10.1 වෙනි දින පරිපාලන කමිටුව රැස්වූ විට රොන්සන් මහතාගේ වාර්තාව සලකා බැලූ බවත් හැකි හැම තැන්හිම එය ක්‍රියාත්මක කිරීමට තීරණය කළ බවත් සභාපතිවරයා පැවසීය. ඉතා අගනා වාර්තාවටත් මාහැඟි අදහස් වලටත් රොන්සන් මහතාට මණ්ඩලයේ ස්තුතිය පල කිරීමට ද තීරණය විය.

(ඇ) දෙනියාය ඉඩම්: අක්කරයක් රුපි. 8,500 කට මිල දී ගැනීමට මණ්ඩලය එකඟ වූවාය.

(ඈ) විගණිතවරු: මෙම කරුණ සාකච්ඡා කරන විට ගණකාධිකාරී තැනද සහභාගි විය. බලාපොරොත්තු වන කාලය තුලදී විගණනය සම්පූර්ණ කිරීමට විධි-විධාන යොදා ගැනීම සඳහා නව විගණිත වරුන් මුණ ගැසෙන ලෙස ගණකාධිකාරිට නියම කෙරිණ.

(ඉ) ආයෝජන: මෙම කරුණ සාකච්ඡා කරන විට ගණකාධිකාරී සහභාගි විය.

පහත දැක්වෙන පරිදි රුපි. 1,000,000 ක් ස්ථිර තැන්පතුවල නැවතත් ආයෝජනය කරන ලද බැව් මණ්ඩලය සඳහන් කර ගත්තාය.

රුපි. 800,000 — 4 1/4% මාස 3
රුපි. 200,000 — 4 1/4% මාස 13

(ඊ) ඉන්දියාවත් සමග වානිජ සහ ආර්ථික සබඳතා පිළිබඳ සාකච්ඡා:

මණ්ඩලය විසින් දරණ අදහස් සලකා බලා ඉන්දියාව සහ ලංකාව යන දෙරට අතර පර්යේෂණ සම්බන්ධයෙන් කොතෙක් දුරට සබඳතා පවත්වාගත යුතු දැයි තීරණය කිරීම අධ්‍යක්ෂක වරයාට පැවරීමට මණ්ඩලය තීරණය කළාය.

(උ) 24 වන ටොක්ලායි සම්මේලනය:

ටොක්ලායි සම්මේලනයට සහභාගිවීම සඳහා ආචාර්ය පෙතියාගොඩ, ආචාර්ය කීර්තිසිංහ සහ ආචාර්ය ෂන්මුගනාදන් තේරීමට තීරණය කර ඇති බව අධ්‍යක්ෂකවරයා පැවසීය.

(ඌ) අගරතැන්න මිල දී ගැනීම:

මේ ඔප්පුව පිළිබඳ ජූලියස් සහ ක්‍රිසි සමාගම විසින් ඉදිරිපත් කර ඇති වාර්තාව සඳහන් කර ගන්නා ලදි. බදුල්ල දිස්ත්‍රික්කයේ යටකිඳ කොටසෙහි පිහිටි යූරි කණ්ඩායමට අයිති අගරතැන්න වතුයායෙන් අක්කර 202 රූඩ් 3 ක කොටසක්, රුපි. 146,373 ක මිලකට ලංකා තේ පර්යේෂණායතනය මිලදී ගත යුතුය යන යෝජනාය ආර්. විජේරත්න මහතා යෝජනය කිරීමෙන් සහ එස්. පී. වෛතිලිංගම් මහතා ස්ථිර කිරීමෙන් සම්මත විය. මෙය මිලදී ගත යුත්තේ නහවිල්ල වතුයාය සමාගමෙනි. මණ්ඩලය සමග එකඟ වී ඇති පරිදි කරත්ත පාර භාවිතය සම්බන්ධයෙන් පසුව මණ්ඩලය හා නහවිල්ල වතුයාය සමාගම සමඟ එකඟත්වයකට එලඹ ගිවිසුමක් අත්සන් කළ යුතු වෙයි.

3—1969.10.1 දින පැවැති පරිපාලන කමිටු රැස්වීම් වාර්තා:

(අ) ආචාර්ය ආර්. එල්. වික්‍රමසිංහයන් ගේ දකුණු ඉන්දියානු චාරිකාව:

මෙම කරුණු සාකච්ඡා කරන විට ආචාර්ය කීර්තිසිංහ ද සහභාගි විය. සම්මේලනයට සහභාගිවීම සඳහා වරුසවිතාන මහතාගේ චාරිකය පිළිබඳ වාර්තාව සඳහන් කර ගන්නා ලදි. එම වාර්තාව සම්බන්ධයෙන් සභාපතිවරයා වරුසවිතාන මහතාට ස්තුති කළේය.

(ආ) ලංකා වතුයාය සේවක සංගමය:

මෙම කරුණ පිළිබඳව තමා ලංකා වතුයාය සේවක සම්මේලනය විමසූ බව ලේකම්වරයා පැවසීය. තමන් කැමැති නම් ලංකා වතුයාය සේවක සංගමයේ සාමාජිකයන්ට තේ පර්යේෂණායතන අර්ථසාධක අරමුදලට දයක මුදල් ගෙවීමට ඉඩදිය හැකිය. එහෙත් සෑම නව ප්‍රවේශකයකුම වතුයාය සේවක අර්ථසාධක අරමුදලට දයක මුදල් ගෙවිය යුතුවේ.

(ඇ) 1969 සැප්තැම්බර් 20 වෙනි දින පැවති මණ්ඩල විශේෂ කමිටු රැස්වීමේ තීරණ:

බී 33/22/10/69 පත්‍රිකාව මගින් චක්‍රලේඛනය කොට තිබුණු විශේෂ කමිටුවේ නිර්දේශ අනුමත කරන ලදි. එස්. ජී. වෛතිලිංගම් මහතා ගේ යෝජනය පී. හෙට්ටිආරච්චි මහතා ස්ථිර කිරීමෙන් 1969.10.1 වෙනි දින පැවැති පරිපාලන කමිටු රැස්වීම් වාර්තා සම්මත විය.

4—1969 ජූලි 12 සහ 1969 සැප්තැම්බර් 17 වෙනි දින පැවැති අත්හද බැලීම් සහ වතුයාය කමිටු රැස්වීම් වාර්තා:

1969.9.17 පැවැති මෙම කමිටුවේ අනුකාරක සභා රැස්වීම් වාර්තාව සඳහන් කරගන්නා ලදි.

එස්. පී. වෛතිලිංගම් මහතාගේ යෝජනය ජී. හෙට්ටිආරච්චි මහතා ස්ථිර කිරීමෙන් ජූලි 12 සහ සැප්තැම්බර් 17 වෙනි දින පැවැති රැස්වීම් වාර්තා සම්මත විය.

5—නිලධාරි කටයුතු:

(අ) එක්සත් රාජ්‍ය ජනපදයේ ඉන්දියානාවේ කෘමි විද්‍යා අංශයෙන් ලද ලිපියක්:

කෘමි වසංගතයන් පිළිබඳ කරන ලද අගනා වැඩ පසසා එක්සත් රාජ්‍ය ජනපදයේ කෘමි විද්‍යා පර්යේෂණාංශයෙන් ආචාර්ය දන්තනාරායන වෙත එවන ලද ලිපියක් සඳහන් කර ගන්නා ලද අතර ඒ පිළිබඳ සතුට ද පළ කරන ලදි.

(ආ) ආචාර්ය පී. සිවපාලන්:

බ්‍රිතාන්‍ය ක්ලොම්බියාවේ ජෛව විද්‍යා දෙපාර්තමේන්තුවේ වසංගත පිළිබඳ මධ්‍යස්ථානය මගින් පලකරන්නට යන ආර්ථික නෙමෙටෝඩ විද්‍යාව පිළිබඳ ග්‍රන්ථයට තේවල නෙමෙටෝඩ වසංගත පිළිබඳ පරිච්ඡේදයක් සපයන ලෙස තේවල නෙමෙටෝඩ වසංගත සම්බන්ධයෙන් ලෝකයේම විශේෂඥ වන ආචාර්ය පී. සිවපාලන්ගෙන් ඉල්ලීමක් කර ඇති බව අධ්‍යක්ෂකවරයා පැවසීය. මෙම ඉල්ලීම තමා නිර්දේශ කරන බවද අධ්‍යක්ෂකවරයා පැවසීය. මණ්ඩලය අනුමත කළාය.

6—මුදල්:

1969 සැප්තැම්බර් මාසය අඩංගු එම වර්ෂය සඳහා වැය පිළිබඳ ප්‍රකාශනයත් 1970 සඳහා ඇස්තමේන්තු ද මුදල් පිළිබඳ ඉදිරි ප්‍රකාශණය ද නොවැම්බර් 17 වෙනි දින පවත්වන පරිපාලන කමිටුව මගින් සලකා බලනු හැකිවනු සඳහා චක්‍ර ලේඛනය කරන බව සඳහන් කර ගන්නා ලදි.

7—වෙනත් කරුණු:

(අ) නිෂ්පාදනය පිළිබඳ උප කමිටුව:

මෙම කරුණ සාකච්ඡා කරන විට ආචාර්ය කීර්තිසිංහ ද සහභාගි විය. 69.8.7 වෙනි දින රැස්වීමේ වාර්තා අඩංගු බී 24-22/10/69 පත්‍රිකාව සඳහන් කරගන්නා ලදි. කමිටුවේ අන්තිම රැස්වීම 1969.10.21 වෙනි දින පැවැති බවත් එම රැස්වීම් වාර්තා චක්‍ර ලේඛනය කරන බවත් ආචාර්ය කීර්තිසිංහ පැවසුවේය.

(ආ) තේ නිෂ්පාදනය හා කර්මාන්ත ශිල්පය පිළිබඳ කමිටුවේ සභාපතිත්වයෙන් ජේ. එෆ්. ඒ. පී. පීරිස් මහතා ඉල්ලා අස්වීම:

ජෝර්ජ් ස්ටුවට සහ සමාගමේ සභාපති වශයෙන් තමා පත් කොට ඇති හෙයින් අධික වැඩ හේතු කොට ගෙන මෙම කමිටුවේ සභාපති වශයෙන් තවදුරටත් කටයුතු කිරීමට නොහැකි හෙයින් සභාපති තනතුරින් ඉල්ලා අස්වීම දන්වා පීරිස් මහතා විසින් එවන ලද ලිපියක් සභාපති වරයා කියෙව්වේය. මෙම ඉල්ලා අස්වීම මහත් අකැමැත්තෙන් මණ්ඩලය භාරගත් අතර කරන ලද අගනා සේවයට මණ්ඩලයේ ස්තුතිය ද පල කළාය. මෙම කමිටුව වෙත පවරන ලද වැඩ දැන් සමාප්ත කර ඇති හෙයින් සභාපති වරයකුව නැවත පත් කිරීමේ ප්‍රශ්නය පැන නොනැගින.

(ඇ) මණ්ඩලයේ මුද්‍රාව:

පහත සඳහන් ලියකියවිලි වල මණ්ඩලයේ මුද්‍රාව තබන ලද බැව් වාර්තා කරන ලදි.

(අ) 69.9.11 වෙනි දින එස්. පත්මනාදන්, සී. වංමුගම් සහ ආචාර්ය එල්. එච්. ප්‍රණාන්දු යන මහතුන් ඉදිරිපිට කොළඹ දී, ආචාර්ය ආර්. එල්. ද සිල්වා ගේ අධිශිෂ්‍යත්ව ගිවිසුමෙහි,

(ආ) එස්. පත්මනාදන්, ජී. ඩී. ලෝස් සහ ආචාර්ය එල්. එච්. ප්‍රණාන්දු යන මහතුන් ඉදිරිපිට ඩබ්. ඒ. සී. ද සිල්වා මහතා කොළඹ කොමර්ෂල් සමාගමේ පුහුණු කිරීම සම්බන්ධයෙන් 69.10.1 වෙනි දින දරණ ගිවිසුමට,

(ඈ) අධිශිෂ්‍යත්ව උඩ පිටත්ව යෑම:

ෆුල්බ්‍රයිට් අධිශිෂ්‍යත්වයක් උඩ 1969 සැප්තැම්බර් මස 13 වෙනි ද ආචාර්ය ආර්. එල්. ද සිල්වා දිවයිනෙන් පිට වූ බව වාර්තා කරන ලදි.

(ඉ) විදෙස් පුහුණුවෙන් පසු පෙරළා පැමිණීම:

විදෙස් පුහුණුවෙන් පසු පහත සඳහන් නිලධාරීන් ආපසු පැමිණි බැව් වාර්තා කර ගන්නා ලදී.

(1) විද්‍යා හා කර්මාන්ත ශිල්පය පිළිබඳ ඉම්පීරියල් විද්‍යාලයෙන් පී.එච්.ඩී. උපාධිය ලැබ ජෛව රසායන විද්‍යාංශයේ පර්යේෂණ නිලධාරී ජී. ආර්. රොබට්ස් මහතා 69.10.2 වෙනි දින ආපසු පැමිණියේය.

(2) වෙයි විද්‍යාලයේ එම් පිල්. උපාධිය තෙක් පශ්චාත් උපාධි අධ්‍යයනය කෙළවර කොට ශාක ව්‍යාධි වේදංශයේ කර්මාන්තඥ සහායක පී. වී. අරුල්-ප්‍රගාසම් මහතා 69.10.13 වෙනි දින පෙරලා පැමිණියේය.

(ඊ) නිලධාරී වෙනස්වීම:

පත්වීම:

ටී. එෆ්. හලල්දීන් මහතා—ලඝුලේඛක/ලිපිකරු/යතුරුලේඛක/රුපි. 200/- මාසික වැටුපක් උඩ 69.9.1 සිට,

කේ. ආර්. ජේ. ඩික්සන් මහතා, විද්‍යාගාර කාර්ය සහායක ශාකව්‍යාධි වේදංශය—රුපි. 60/- මාසික වැටුපක් උඩ 69.9.6 සිට,

පී. නල්ලයියා මහතා විද්‍යාගාර කාර්ය සහායක කෘෂිරසායනාංශය රුපි. 60/- මාසික වැටුපක් පිට 69.9.7 සිට.

ඉල්ලා අස්වීම්:

එම්. ටී. සුබ්‍රමානියම් මහතා කර්මාන්ත ශිල්පාංශයේ කර්මාන්තඥ සහයක 69. 10. 15 සිට (පසුව අස්කර ගන්නා ලදි).

රැස්වීම ප.ව. 12.20 ට කෙළවර විය.

ඩබ්. ඩී. ඒ. ඊ. එස්. වනිගසේකර
ලේකම්.

## 1969 දෙසැම්බර් 20 වෙනි දින පෙ.ව. 9.00 ට කොළඹ පැවැති ලංකා තේ පර්යේෂණායතන මණ්ඩල රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාවයි.

පැමිණි අය: පී. ජේ. සී. ඩරන්ට්, එල්. සී. ද මැල්, ඩී. ඊ. හෙට්ටිආරච්චි, ජී. හෙට්ටි-ආරච්චි, එම්. බී. හෝස්පෝල්, එස්. කේ. ඩී. ජයමාන්න, ජී. ඩී. ලෝස්, ජී. බී. මිඩ්ල්ටන්, එස්. පත්මනාදන් (සභාපති), ජේ. එල්. ඩී. පීරිස්, ජේ. එෆ්. ඒ. පී. පීරිස්, එම්. රාජේන්ද්‍රම්, ජේ. ආර්. සමර්විල්, එස්. පී. වෛතිලිංගම්, ආචාර්ය එල්. එච්. ප්‍රණාන්දු (අධ්‍යක්ෂක) සහ ඊ. වනිගසේකර (ලේකම්).

අධ්‍යක්ෂක ගේ ලේකම් ජී. ඒ. එස්. ගුනසිංහ ද පැමිණ සිටියේය.

**1—1969 ඔක්තෝබර් 22 වෙනි දින පැවැති රැස්වීම :**

එස්. කේ. ඩී. ජයමාන්න මහතා ගේ යෝජනය ජී. හෙට්ටිආරච්චි මහතා ස්ථිර කිරීමෙන් වාර්තාව සම්මත විය.

**2—වාර්තාවෙන් උද්ගත වන කරුණු :**

(අ) වාහන භාවිතය විධිමත් කිරීම: ආයතනයේ වාහන භාවිතය විධිමත් කිරීම සම්බන්ධයෙන් චක්‍ර ලේඛනය කරන ලද බී 45 20/12/69 දරණ පත්‍රිකාව සාකච්ඡා කරන ලදි.

(ආ) බස් රථයක් සහ මෛක්‍රෝ බස් රථයක් මිල දී ගැනීම: ආසන 40 කට බස් රථයක් මිල දී ගත යුතුය යන පරිපාලන කමිටුවේ නිර්දේශය මණ්ඩලය අනුමත කළාය.

(ඇ) වානිජ හා ආර්ථික සහයෝගය පිළිබඳ කථා: ඉන්දියාවේ තේ මණ්ඩලයේ, පර්යේෂණ සම්බන්ධ කරණ නිලධාරී ආචාර්ය කේ. කේ. මිත්‍රාට ප්‍රාරම්භක සාකච්ඡා සඳහා ඇරැයුම් කොට ඇතැයි අධ්‍යක්ෂක වරයා පැවසීය. පිළිතුරක් බලාපොරොත්තු වේ.

(ඉ) ආචාර්ය එෆ්. ආර්. ටබ්ස් ගේ පැමිණීම: ආචාර්ය ටබ්ස් ජනවාරි 17 වෙනි දින පැමිණ පෙබරවාරි මස 3 වෙනි දින පිටත්ව යන බව අධ්‍යක්ෂක වරයා පැවසීය. වර්ධන ප්‍රචාරක තේ සම්බන්ධයෙන් ලද ප්‍රගතිය ද අනෙක් බෝග වගාව සම්බන්ධ කරුණු ද පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා දීමට ක්‍රියා පිළිවෙලක් යොද ඇති බව අධ්‍යක්ෂක වරයා පැවසීය. ඔහු වතුයායන් ද තේ පර්යේෂණායතන මධ්‍යස්ථාන ද බලන්නට යනු ඇත. මණ්ඩලයේ මහතුන්ට ආචාර්ය ටබ්ස් මුණ ගැසීමට හැකි වනු පිණිස ජනවාරි 29 වෙනි දින සාන්ත කුම්බස් හී විශේෂ රැස්වීමක් පැවැත් වීමට තීරණය කරන ලදි. මෙම රැස්වීමට දෙවු හා අන්තර්මධ්‍ය නිලධාරීන් ද සහභාගී වනු ඇත.

(ඊ) මොටෝ සයිකල් මිල දී ගැනීම: ආයතනයේ අනාගත වුවමනා අනුව මොටෝ වාහන අවශ්‍යතා පිළිබඳ වැඩ සටහනක් සකස් කරන්නේ නොමැති දැයි වෛති-ලිංගම් මහතා නැගු ප්‍රශ්නයකට අනතුරුව 1970 වර්ෂය සඳහා ප්‍රංශ, බ්‍රිතාන්‍ය හෝ ජර්මන් ආධාර යටතේ ස්ටේෂන් වැගන් තුනක් මිල දී ගැනීමට තීරණය කළාය.

**3—1969 නොවැම්බර් 17 වෙනි දින පැවැති පරිපාලන කමිටු රැස්වීම් වාර්තා:**

(අ) අත්හද බැලීම් හා වතුයාය අනුකාරක සභාව මගින් 1969 ඔක්තෝබර් 30 වෙනි දින ගත් තීරණ:

විශේෂ කමිටුවේ පහත සඳහන් නිර්දේශයන් පරිපාලන කමිටුව මගින් අනුමත කරන ලදි:

(1) සාන්ත කුම්බස් සහ සාන්ත ජොයකිම් වතුයායවල මාසික වැටුප් ලබන නිලධාරීන් සඳහා 1968 වර්ෂය වෙනුවෙන් මාස තුනක වැටුප් ප්‍රසාද මුදල් වශයෙන් ගෙවීම.

(2) දැනට වතුයාය වල වැඩ කරන එනමුත් තේ පර්යේෂණායතන අර්ථසාධක අරමුදලට දයක මුදල් ගෙවන, නිලධාරීන්ට ඔවුන්ගේ අභිමතය පරිදි අනාගතයේදී ද තේ පර්යේෂණායතන අර්ථසාධක අරමුදලට වතුයාය අර්ථ සාධක අරමුදල් දයක මුදල් ප්‍රමාණයන් ගෙවිය හැකිය. ඔවුන්ගෙන් කිසිවකු යම් කිසි දිනක ආයතනයෙන් අස් වී වතුයායකට බැඳෙතොත් හෝ වතුයාය අර්ථ සාධක අරමුදලට දයක මුදල් ගෙවීමට තීරණය කළහොත් තේ පර්යේෂණායතන අර්ථ සාධක අරමුදලෙහි ඇති මුදල් වතුයාය සේවක අර්ථ සාධක අරමුදලට මාරු කළ යුතුවේ. සියලුම නව ප්‍රවේශකයන් වතුයාය සේවක අර්ථ සාධක අරමුදලට දයක මුදල් ගෙවිය යුතුවේ.

(3) වතුයායේ වැඩ කරන ලිපි කරුවකුද, ක්ෂෙත්‍ර හෝ කම්හල් නිලධාරියකු තේ පර්යේෂණායතනයේ වැඩ කිරීම නිසා අතිරේක වගකීම් දරන්නට සිදුවන්නේ නම් එවැනි නිලධාරියකුට ඔහුගේ මූලික වැටුපෙන් සියයට 15 සිට 25 දක්වා අමතර ව ගෙවිය හැකිය.

(4) සාන්ත කුම්බස් වතුයායේ මුල් ලිපිකරු වශයෙන් වැඩ බලන දෙවු සහකාර ලිපිකරු එච්. එන්. ද සිල්වා මහතා 1970 ජනවාරි මස සිට මුල් ලිපිකරු වශයෙන් පත් කිරීම.

(5) සාන්ත කුම්බ්ස් වතුයායෙන් අධිකාරි වෙත දැනට ගෙවෙන බදු අය කළ හැකි රුපියල් 400/- ක මාසික දීමනාව වෙනුවට ඔහු විසින් නියත වශයෙන්ම දරන්නට වන ප්‍රවාහන වියදම් රුපියල් 400/- ක උපරිම සීමාව දක්වා ගෙවිය යුතුය. මෙය සාන්ත කුම්බ්ස් හී කෘෂිකර්මාන්තඥට ද ගෙවිය යුතුය. මෙය අනුමත වූයේ මසකට ධාවනය කෙරෙන හැතපුම් ගණනට පමණක් ගෙවිය යුතුය හා ගමන් වියදම් වවුචරය අධ්‍යක්ෂක තුමා විසින්ම අනුමත කළ යුතුය යන කොන්දේසිය උඩය.

(ආ) සුබසාධක ප්‍රවාහන පහසුකම් වෙනුවට දීමනාවක් ගෙවීම

සුබසාධක ප්‍රවාහන පහසුකම් සලසා නැතිකම හේතු කොටගෙන සාන්ත කුම්බ්ස් සහ සාන්ත ජොයකිම් යන ස්ථාන වලින් පිට වෙසෙන නිලධාරීන්ට මසකට රුපි. 25/- ක දීමනාවක් ගෙවීම පිළිබඳව වූ පරිපාලන කමිටු නිර්දේශය මණ්ඩලය අනුමත කළාය.

(ඇ) ආචාර්ය ඩබ්. දන්තනාරායනගේ ඉල්ලා අස්වීම

ආචාර්ය දන්තනාරායන ඕස්ට්‍රේලියාවේ තනතුරක් ලැබ අස්ව යන බවත් ඔහු අස්වීමට හේතු හුදෙක් පෞද්ගලික යැයි අධ්‍යක්ෂක වරයා පැවසීය. මෙම අස්වීම කණගාටුවෙන් යුතුව මණ්ඩලය සඳහන් කරගත් අතර ආචාර්ය දන්තනාරායන ආයතනය සමඟ බැඳුණු ගිවිසුමේ කොන්දේසි වලට අනුකූලතාවය දැක්විය යුතු වග ද සඳහන් කර ගැනිණ. ආචාර්ය දන්තනාරායන ආයතනයට කළ සේවය අගය කොට සලකන බව ද සඳහන් විය. ආචාර්ය කාල්නයිදු ආපසු ලංකාවට පැමිණෙන තෙක් ආචාර්ය සීවපාලන් කෘෂි විද්‍යාංශයේ වැඩ බැලිය යුතු යැයි ද තීරණය විය.

ජේ. ආර්. සමර්විල් මහතාගේ යෝජනය එස්. කේ. ඩී. ජයමාන්න මහතා ස්ථිර කිරීමෙන් 1969 නොවැම්බර් 17 වෙනි දින පැවැති පරිපාලන කමිටු රැස්වීම් වාර්තා සම්මත විය.

## 4—(අ) 1969 ඔක්තෝබර් 30 වෙනි දින පැවැති අත්හදා බැලීම් සහ වතුයාය උප කමිටු රැස්වීම් වාර්තා

එස්. පී. වෛතිලිංගම් මහතාගේ යෝජනය ජී. හෙට්ටිආරච්චි මහතා ස්ථිර කිරීමෙන් 1969 ඔක්තෝබර් 30 වෙනි දින පැවැති රැස්වීම් වාර්තා සම්මත විය.

(ආ) 1969 ඔක්තෝබර් 30 වෙනි දින පැවැති ගොඩනැගිලි කමිටු රැස්වීම් වාර්තාව

එස්. පී. වෛතිලිංගම් මහතාගේ යෝජනය, ජී. හෙට්ටිආරච්චි මහතා ස්ථිර කිරීමෙන් 1969 ඔක්තෝබර් 30 වෙනි දින පැවැති රැස්වීම් වාර්තා සම්මත විය.

(ඇ) 1969/ඔක්තෝබර් 31 වෙනි දින පැවැති වතුයාය සහ අත්හද බැලීම් කමිටු රැස්වීම

1970 වර්ෂය සඳහා වූ සාන්ත කුම්බ්ස් වතුයාය සහ සාන්ත ජොයකිම් වතුයාය ඇස්තමේන්තු සඳහන් කර ගන්නා ලදී.

එස්. පී. වෛතිලිංගම් මහතාගේ යෝජනය ජී. හෙට්ටිආරච්චි මහතා ස්ථිර කිරීමෙන් 1969 ඔක්තෝබර් 31 වෙනි දින පැවැති රැස්වීම් වාර්තා සම්මත විය.

(ඈ) 1969 දෙසැම්බර් මස 6 වෙනි දින පැවැති අත්හද බැලීම් සහ වතුයාය අනුකාරක සභා රැස්වීම්

එස්. පී. වෛතිලිංගම් මහතාගේ යෝජනය ජී. හෙට්ටිආරච්චි මහතා ස්ථිර කිරීමෙන් 1969 දෙසැම්බර් 6 වෙනි දින පැවැති රැස්වීම් වාර්තා සම්මත විය.

(ඉ) සාන්ත කුම්බ්ස් වතුයාය සඳහා වූ විගණිත වාර්තාව ද ඒ පිළිබඳව කෘෂි කර්මාන්තඥ දී ඇති අදහස් ද සාකච්ඡා කරන ලදී.

(ඊ) සාන්ත ජොයකිම් වතුයාය සඳහා වූ විගණිත වාර්තාව ද ඒ සම්බන්ධයෙන් වතු අධිකාරී දක්වා ඇති අදහස් ද සාකච්ඡාවට භාජනය කරන ලදී.

5. <u>නිෂ්පාදනය පිළිබඳ අනුකාරක සභා රැස්වීම් වාර්තා</u>

1969 ඔක්තෝබර් 21 වෙනි දින පැවැති රැස්වීම් වාර්තාව සඳහන් කර ගන්නා ලදී. මෙම කමිටුව මගින් කරන ලද සේවය අගය කිරීමේ ස්තුති යෝජනයක් සමර්විල් මහතා යෝජනා කොට ජයමාන්න මහතා ස්ථිර කිරීමෙන් සම්මත විය.

6. <u>නිලධාරි කටයුතු</u>

(අ) මොටෝ රථ සහ මොටෝ සයිකල් ගැනීම සඳහා ණය

රජයේ දෙපාර්තමේන්තු මගින් මෙවැනි පරමාර්ථයක් සඳහා දෙනු ලබන ණය සඳහා වන කොන්දේසි අනුව මෙම ණය දීමට ද මණ්ඩලය අනුමත කළාය.

(ආ) ආචාර්ය ආර්. එල්. වික්‍රමසිංහ වෙනුවට වැඩබැලීම

1969.11.24 වෙනි දින සිට, ජෛව විද්‍යාංශයේ වැඩබැලීම සඳහා ආචාර්ය ආර්. ආර්. සෙල්වේන්ද්‍රන් පත් කිරීමටත්, පහත රට ස්ථානය භාරව වැඩ කිරීමට ආචාර්ය ඩී. වී. වෙත්තසිංහ පත් කිරීමටත් අධ්‍යක්ෂක වරයා යොද තිබූ වැඩ පිළිවෙල මණ්ඩලය අනුමත කළාය.

(ඇ) 69.11.21 වෙනි දින පැවැති විශේෂ කමිටු රැස්වීමේ දී එළඹි තීරණ

1969.11.21 වෙනි දින පැවැති විශේෂ කමිටු රැස්වීමේදී එළඹි පහත සඳහන් තීරණයන් මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

(1) කනිටු නිලධාරි විශේෂ ශ්‍රෙණියට උසස් වීම් ලැබීම් නිසා අය විය යුතු හිඟ වැටුප් සී. කීර්තිරත්න මහතාට ගෙවීම. විශේෂ ශ්‍රෙණියට පත් වීමෙන් පසුව නිලධාරියකුට අතිකාල දීමනා ගෙවීම පිළිබඳ ප්‍රශ්නය නව වැටුප් සංශෝධනයෙන් පසුව තීරණය කරනු ඇත.

(2) දෙවු ශ්‍රෙණියේ සිටින නිලධාරීන් අංශ ප්‍රධානීන් වශයෙන් ක්‍රියා කරන විට අතිරේක වැටුප් අධික දෙකක් ගෙවීම හා අංශ ප්‍රධානීන් වශයෙන් වැඩ බලන දෙවු ශ්‍රෙණි නිලධාරීන්ට රුපි. 100/- ක මාසික දීමනාවක් ගෙවීම.

(3) දෙවු ශ්‍රෙණි තනතුරුවල වැඩ බලන අන්තර් මධ්‍ය ශ්‍රෙණි නිලධාරීන්ට රුපි. 75/- ක මාසික දීමනාවක් ගෙවීම.

(4) නිවාඩු ගනන් ගැනීම පහත දක්වෙන අයුරින් කිරීම :

විවේක හා අනියම් නිවාඩු. සතියක් දින පහමාරක් වශයෙන් සැලකීම.

වෛද්‍ය නිවාඩු: සතියක් වැඩ කරන දින 6 ක් වශයෙන් සැලකීම, පෙර පෝය සම්පූර්ණ වැඩ කරන දිනයක් සේ සලකනු ලැබේ.

(ඇ) ගස්ගුල්ලන් මර්ධන ව්‍යාපාරය පිළිබඳව දක්වා ඇති ප්‍රගතිය පිළිබඳව ප්‍රසාදය පලකොට වොෂින්ටනයේ කෘමි විද්‍යා පර්යේෂණාංශයේ සහකාර අධ්‍යක්ෂක එච්. සී. කොක් මහතා එවා ඇති ලිපියක් කෘතඥ පූර්වකව සඳහන් කර ගන්නා ලදී.

"ඉතා දුෂ්කර ආර්ථික ගැටලුවක් විසඳීම සම්බන්ධයෙන් ආචාර්ය දන්තනාරායන සතුටුදායක ප්‍රගතියක් ලබා ඇති බව මෙම ව්‍යාපාරය සම්බන්ධ විද්‍යාඥ ආචාර්ය රොබර්ට් ඊ. ඩොල්පින් වාර්තා කරයි. පර්යේෂණ සම්බන්ධයෙන් ඔහුගේ දෘෂ්ටිය හා ක්‍රමයන් තකූ හුරුයම යෝග්‍යය. විශේෂයෙන් බෙන්ලේම් දිලීර නාසකය පිළිබඳ අගැයීම සහ කුහර සෑදීමට ජීව කෘෂමීන් යොද ගැනීම සම්බන්ධයෙන් අපි වඩාලාම උනන්දු වීමු."

## 7. මුදල්

පහත දක්වා ඇති පත්‍රිකාවන් පරිපාලන කමිටුව වෙත බෙද හරින ලද බවත් 1969 නොවැම්බර් 17 වෙනි දින පැවැති පරිපාලන කමිටු රැස්වීමේ දී මේවා සාකච්ඡා කළ බවත් සභාපතිවරයා පැවසීය. මේ සම්බන්ධයෙන් සාමාජිකයන්ට අදහස් ප්‍රකාශ කළ හැකිය.

(අ) අයහාර සහ ප්‍රාග්ධන වැය ප්‍රකාශනය. 69.9.30 දක්වා ඒ 45-17/11/69 පත්‍රිකාව.

(ආ) ඉහත ප්‍රකාශනය සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කිරීම. ඒ 48-17/11/69 පත්‍රිකාව.

(ඇ) 1969 සඳහා පරිපූර්ණ වැය ඒ 47-17/11/69 පත්‍රිකාව.

(ඈ) 1970 සඳහා ගණන් බැලූ අය වැය ප්‍රකාශනය.
1970 සඳහා මිල මුදල් ප්‍රකාශනය.
ඒ 46-17/11/69.

(ඉ) 1970 සඳහා ඇස්තමේන්තු.

බොහෝ දුරට සාකච්ඡා කිරීමෙන් පසුව අධ්‍යක්ෂක වරයා සඳහන් කළ පරමාර්ථයන් සඳහා අත්හද බැලීම් සහ වතුයාය කමිටුව ස්ථාන කමිටුවක් වශයෙන් ක්‍රියා කළ යුතුයැයි තීරණය විය. තේ පර්යේෂණායතන මණ්ඩලයේ සභාපතිවරයා ස්ථාන කමිටුවේ සභාපති වන අතර අධ්‍යක්ෂක වරයා එම රැස්වීම් කැඳවන්නා වශයෙන් ක්‍රියා කරනු ඇත. අත්හද බැලීම් සහ වතුයාය කාරක සභාව ස්වාධීනව ක්‍රියා කරන අතර අධ්‍යක්ෂක වරයා එහි සභාපතිවරයා වේ. 1970 සඳහා ඇස්තමේන්තු මෙයට වඩා සවිස්තරාත්මකව මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු යැයි මණ්ඩලය අදහස් කළාය.

සමර්විල් මහතා ගේ යෝජනය ජේ. එෆ්. ඒ. පී. පීරිස් මහතා ස්ථිර කිරීමෙන් 1970 සඳහා වූ ඇස්තමේන්තු මණ්ඩලය අනුමත කළාය.

## 8. කාර්යාල කාර්ය සංග්‍රහය

චක්‍රලේඛනය කරන ලද කෙටුම්පත් කොට තිබූ කාර්යාල කාර්ය සංග්‍රහය අනුමත කළාය.

## 9. වෙනත් කරුණු

(අ) මණ්ඩලයේ වෙනස්වීම් සහ පත්වීම්

(1) පහත්රට නිෂ්පාදකයන් ගේ සංගමය නියෝජනය සඳහා එස්. පත්මනාදන් සහ ජේ. එල්. ඩී. පීරිස් යන මහතුන් 69.11.20 දින සිට එම සංගමය මගින් නැවතත් පත් කරන ලද බව.

(2) ජේ. ආර්. සමරවිල් මහතා නැවත පැමිණ ඇති හෙයින් 69.10.31 දින සිට ආර්. විජේරත්න මහතා ඔහු නියෝජනය නොකරන බව.

(3) එම්. බී. හෝස්පෝල් මහතා නැවත පැමිණ ඇති හෙයින් 69.11.5 දින සිට ඔහු වෙනුවෙන් වැඩ බැලූ ජේ. බැංක්ස් මහතා ගේ තැන ගත් බව.

වාර්තා කරන ලදි.

මණ්ඩලයෙන් ඉවත්ව යන සාමාජිකයන්ට ඔවුන් ගේ සේවය සම්බන්ධයෙන් සභාපතිවරයා ස්තුති කලේය.

(ආ) මණ්ඩලයේ මුද්‍රාව

පහත දැක්වෙන ලියකියවිලිවල මණ්ඩලයේ මුද්‍රාව තබන ලද බැව් වාර්තා කරන ලදි.

(1) ආචාර්ය ආර්. එල්. වික්‍රමසිංහගේ අධි ශිෂ්‍යත්ව ගිවිසුමෙහි 1969 නොවැම්බර් 21 වෙනි දින එස්. පත්මනාදන්, ජී. ඩී. ලෝස් සහ සී. චංමුගම් යන මහතුන් ඉදිරිපිට දී.

(11) ආචාර්ය ආර්. එල්. වික්‍රමසිංහ සහ ආචාර්ය එල්. එච්. ප්‍රණාන්දු යන අය ක්ෂණික තේ සම්බන්ධයෙන් කරුණු රහසිගතව තබා ගැනීමට ආයතනය සමග එකඟ වූ ගිවිසුමට 1969 නොවැම්බර් 21 වෙනි දින කොළඹ දී එස්. පත්මනාදන්, ජී. ඩී. ලෝස් සහ සී. පී. චංමුගම යන මහත්වරුන් ඉදිරිපිට දී.

(111) ආචාර්ය ආර්. ආර්. සෙල්වෙන්ද්‍රන් සහ ආචාර්ය ජී. ආර්. රොබර්ට්ස් යන අය ක්ෂණික තේ සම්බන්ධයෙන් කරුණු රහසිගතව තබා ගැනීමට ආයතනය සමග එකඟ වූ ගිවිසුමකට 1969 නොවැම්බර් 21 වෙනි දින කොළඹ දී එස්. පත්මනාදන්, ජී. ඩී. ලෝස් සහ සී. පී. චංමුගම් යන මහත්වරුන් ඉදිරිපිට දී.

(ඇ) අධි ශිෂ්‍යත්වය උඩ පිටත්ව යෑම

පුල්බ්‍රයිට් අධි ශිෂ්‍යත්වයක් උඩ ආචාර්ය ආර්. එල්. වික්‍රමසිංහ 1969 නොවැම්බර් 24 වෙනි දින මාස 11 ක කාල සීමාවකට දිවයිනෙන් පිටත්ව ගිය බව වාර්තා කරන ලදි.

(ඈ) පත්වීම්

පහත සඳහන් පත්වීම් සඳහන් කර ගන්නා ලදි.

(1) වී. ඊස්වරනාදන් මහතා අභ්‍යන්තර විගණන වශයෙන් 69.11.2 දින සිට රුපි. 645/- ක මාසික වැටුපක් උඩ.

(11) එන්. එම්. සේදර මහතා ගණක ලිපිකරු 69.11.11 සිට රුපි. 150/- ක මාසික වැටුපක් උඩ.

පත් කර ගන්නා ලද බැව් වාර්තා කරන ලදි.

(ඉ) ඉල්ලා අස්වීම්

එම්. එම්. පලනිමුත්තු මහතා සහකාර දුරකථන ක්‍රියාකරු 69.12.1 දින සිට.

(ඊ) මරණ

සංඛ්‍යා ලේඛන අංශයේ කර්මාන්තශාලා සහායක කේ. සීවරත්නම් මහතාගේ මරණය කණගාටුවෙන් යුතුව සඳහන් කරගන්නා ලදි. සීවරත්නම් මහතා ආයතනයට කළ

සේවය මණ්ඩලය අගය කරන බවත් ඒ මහතා ගේ මරණය ගැන මණ්ඩලයේ කණගාටුව ප්‍රකාශ කොටත් සීවරත්නම් මහත්මිය සහ පවුලේ අනෙක් අය වෙත දන්වා ලිපියක් යවන ලෙස ලේකම් වරයා ගෙන් ඉල්ලා සිටින ලදී.

(උ) මණ්ඩලයේ අනෙක් රැස්වීම

ලංකාවෙන් පිට වීමට පෙර මණ්ඩලය ඇමතීමට ආචාර්ය එෆ්. ආර්. ටබ්ස් ට අවස්ථාවක් දෙනු සඳහා 1970 ජනවාරි මස 29 වෙනි දින මණ්ඩලයේ විශේෂ රැස්වීමක් සාන්ත කුම්බ්ස් හී පැවැත්වීමට තීරණය විය.

(ඌ) අධ්‍යක්ෂක වරයා ගේ යෝජනයක් අනුව ආයතනයේ නිලධාරීන් ගේ වැටුප් සංශෝධනය සම්බන්ධයෙන් සොයා බලා මණ්ඩලය වෙත වාර්තා කිරීමට විශේෂ කමිටුවට බලය පවරන ලදී.

සභාපති වරයා සාමාජිකයන් වෙත සුබ අලුත් අවුරුද්දක් පැතීමෙන් පසුව ප.ව. 1.10 ට රැස්වීම කෙළවර විය.

ඩබ්. ඩී. ඒ. ඊ. එස්. වනිගසේකර,
ලේකම්.

සර්තානන්ද, ශොක්මන් විජේරත්න සහ සමාගම්,
වරලත් ගණකාධිකාරීහු,
තැ. පෙ. අංක 918,
කොළඹ,
1970 සැප්තැම්බර් 13 දින.

ඔඩිටර් ජෙනරාල්,
විගණන කාර්යාලය,
කොළඹ.

ප්‍රිය මහත්මය,

1969 දෙසැම්බර් 31 වෙනි දයින් අවසන්වන
වසර සඳහා
ලංකා තේ පර්යේෂණායතනයේ—ගිණුම්

ඉහත සඳහන් ගිණුම් විගණනය අප විසින් සම්පූර්ණ කොට ඇති අතර මෙම වාර්තාව සමග පහත සඳහන් ලියවිලි වල පිටපත් දහය බැගින් එවමු.

(1) 1969 දෙසැම්බර් මස 31 වෙනි දිනට ශේෂ පත්‍රය.
(2) 1969 දෙසැම්බර් මස 31 වෙනි දිනට අවසන් වන වසර සඳහා අය වැය ගිණුම.
(3) 1969 දෙසැම්බර් මස 31 වෙනි දිනෙන් අවසන් වන වසර සඳහා සාන්ත කුම්බස් සහ සාන්ත ජොයකිම් වතුයායන් සඳහා කාරක ගිණුම්.
(4) 1969 දෙසැම්බර් 31 වෙනි දිනට ආයෝජනයන් පිළිබඳ සාරාංශය
(5) 1969 දෙසැම්බර් 31 වෙනි දිනට අතැති තොග පිළිබඳ විස්තරය.
(6) 1969 දෙසැම්බර් මස 31 වෙනි දිනට ස්ථාවර වත්කම් ලේඛනය, මිල සමුච්චිත ක්ෂය හා ලියා හළ අගය දක්වේ.
(7) 1969 දෙසැම්බර් 31 වෙනි දිනට කාර්ය මණ්ඩල ණය කරුවන් පිළිබඳ සාරාංශය.
(8) 1969 දෙසැම්බර් 31 වෙනි දිනට ණය කරුවන් සහ ණය ශේෂය පිළිබඳ සාරාංශය.
(9) 1969 දෙසැම්බර් 31 වෙනි දිනට තැන්පත් මුදල් පිළිබඳ විස්තරය.
(10) 1969 දෙසැම්බර් 31 වෙනි දිනට අතැති මුදල් පිළිබඳ විස්තරය.
(11) 1969 දෙසැම්බර් 31 වෙනි දිනට ණය හිමියන් හා ප්‍රතිපාදන පිළිබඳ සංක්ෂිප්ත වාර්තාව.
(12) 1969 දෙසැම්බර් 31 වෙනි දිනට පසුගිය වසර සම්බන්ධයෙන් ගැලපීම්.

අපි මෙසේ වාර්තා කරමු :—

වර්ෂයෙහි ප්‍රතිඵලය—ස්ථාවර වත්කම්වල ක්ෂය සඳහා රුපි. 814,884/16 ක් අය කිරීමෙන් පසු වර්ෂයෙහි ප්‍රතිඵල වලින් පෙනී ගියේ රුපි. 497,663/97 ක ලාභයකි. මෙම ලාභය සැදුණේ මෙසේය.

| | | | |
|---|---|---|---|
| ආයතනය—වියදමට වැඩි ආදයම | ... | රුපි. | 380,822.53 |
| සාන්ත කුම්බස් වතුයාය ලාභය | ... | රුපි. | 149,394.93 |
| සාන්ත ජොයකිම් වතුයාය (පාඩුව) | ... | රුපි. | 32,553.40 |
| | | රුපි. | 497,663.97 |

ගැලපීම්—පසුගිය වසර සම්බන්ධයෙන් කරන ලද ගැලපීම් 9 වන උපලේඛනයේ දක්වෙන පරිදි වේ.

මෙම ගිණුමට අය කොට ඇති බොහෝ කරුණු මෙම ගිණුමට අය කරනවා වෙනුවට ආදයමට අය කළ යුතු යැයි අපට හැඟේ. අනාගතයේ දී හැකි හැම අවස්ථාවක දීම මෙවැනි කරුණු අදල ආදයම ගිණුමට අය කළ යුතු යැයි අදහස් කරමු.

1968 වසරෙහි ලාභය රුපි. 772,273 කි. ක්ෂය සඳහා වෙන් කළ මුදල රුපි. 803,748/- කි. 1969 වර්ෂය සඳහා ලාභය රුපි. 497,664/- ක් වූ අතර ස්ථාවර වත්කම් සඳහා ලියා හළ ක්ෂය රුපි. 814,884/- කි. ක්ෂය සඳහා ලියා අත්හල ප්‍රමාණයෙහි රුපි. 11,136 ක වැඩි වීමකට අමතරව ලාභය අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වූයේ පහත දැක්වෙන කරුණු ය.

(1) සාන්ත කුම්බිස් වතුයාය ගෙන යාමෙන් වන ලාභය පසුගිය වසරට වඩා රුපි. 132,720/- කින් අඩු විය.

(2) සෙස් ආදයම අඩුවීම නිසා ආයතනයේ ලාභය පසුගිය වසරට වඩා රුපි. 135,485/- කින් අඩුවීම.

(3) සාන්ත ජොයකිම් වතුයායේ පාඩුව රුපි. 6,401/- කින් වැඩි විය.

ණය හිමියන් සහ ප්‍රතිපාදන—සුළු ණය හිමියන් යටතේ දක්වා ඇති සමහර ශේෂයන් පිළිබඳව පහත දැක්වෙන නිරීක්ෂණයන් ඉදිරිපත් කිරීමට කැමැත්තෙමු.

(අ) ඊ. ජේ. ස්ටැන්ලි අන්තිම කැමැත්ත—පුස්තකාලයට පොත් පත් ගැනීම සඳහා ඊ. ජේ. ස්ටැන්ලි මහතා රුපි. 7,000/- ක මුදලක් ප්‍රදානය කළ බව අපට දැනගන්නට ලැබිණ. මෙම මුදල තවමත් සම්පූර්ණයෙන්ම යොදගෙන නොමැතිය.

(ආ) ජේ. ඊ. ක්‍රුනම්/පොස්ටර්බාර්හැම් රැඳි මුදල් රුපි. 168/89—මෙම මුදල ආදයම් ගිණුමට පවරන ලෙස නිර්දේශ කිරීමට කැමැත්තෙමු.

(ඇ) මෙම දීමනාවන් 1968 දී රුපි. 7,100/- ක් උපයෝගී කොට ඇත. ඉතිරි 12,900 ක මුදල ප්‍රාග්ධනය වියදම් සඳහා යොදවා නොමැත.

(ඇ) අවිනිශ්චිත ගිණුම—මෙම ගිණුමෙහි රුපි. 13,078/- ක හර ශේෂයක්ද රුපි. 1,135/36 ක බැර ශේෂයක් ද විය. මෙම බැර ශේෂයෙන් රුපි. 12,500 මුදලක් ආයතනයේ රියදුරකුට අනතුරු ඔප්පුවක් යටතේ රක්ෂණ සංස්ථාවෙන් ලැබුණු මුදලක් වේ. මෙම මුදල 70-5-7 වෙනි දින කොළඹ දිසාපතිට ගෙවන ලදි. ඉතිරි රුපි. 518/- නිලධාරින්ට ගෙවිය යුතු මුදල් ය. (ආචාර්ය වී. පී. බවානන්දන්ට රුපි. 500/- පසුව ගෙවන ලදි. ආචාර්ය මනිපුර ගෙන් විදුලි ගාස්තු සඳහා වැඩියෙන් අය කරන ලද රුපි. 18/-). හර ශේෂය වන 1,135/36 යෙන් පහත සඳහන් ප්‍රමාණයන් බොහෝ කාලයක සිට අය කර ගත යුතුව තිබුණි.

| | | |
|---|---|---|
| ඉන්ඩස්ට්‍රියල් ඇස්ෂෝල් (ලංකා) සමාගම | ... | 220.00 |
| ඩී. ඩබ්. වික්‍රමරත්න ... ... | ... | .05 |

සෑම ගිණුම් වර්ෂයක් අවසානයේදීම අවිනිශ්චිත ගිණුම වසා යථා ගිණුම් වලට පැවරිය යුතුයැයි අදහස් කරමු.

(ඉ) සුළු සැපයුම් කරුවෝ—සැපයුම් කරුවන් 58 දෙනාගෙන් 34 දෙනකුගෙන් ශේෂය ස්ථිර කිරීම් ලැබිණ. සැපයුම් කරුවන් 3 දෙනකු ශේෂය පිළිබඳ ප්‍රශ්න නැගුහ. පහත සඳහන් සැපයුම් කරුවන් සම්බන්ධයෙන් ප්‍රමාද නොවී ශේෂය පිළිබඳ තීරණයකට එළඹිය යුතුය.

(1) සීමාසහිත බ්‍රවුන් සහ සමාගම

(2) ටකර්ස් ඔටෝඩ්‍රෝම්

(3) සීමාසහිත වොකර්ස් පුත්‍ර සමාගම.

(ඊ) දැනට ණය හිමියන් ගේ ලෙජරයක් පවත් වා ගෙන යනු නොලබන බව පෙන්වා දෙනු කැමැත්තෙමු. සැපයුම් කරුවන් ගේ ගිණුම් මුදල් පදනමක් මත සලකන අතර වර්ෂය අවසානයේ දී ගෙවිය යුතු බිල් සෑම සැපයුම්

කරුවකුටම පිටුව බැගින් වෙන් කොට සැපයුම් කරුවන් ගේ ලෙජරයක් තබා ගැනීම ඉතා වැදගත් යැයි අපි අදහස් කරමු. සැපයුම් කරුවන්ට කරනු ලබන ගෙවීම් මුදල් පොත් මාර්ගයෙන් හර කළ යුතු අතර භාණ්ඩ මිලදී ගැනීම් භාණ්ඩ ගැණීම පොතක මාර්ගයෙන් සැපයුම් කරුවන්ගේ පෞද්ගලික ගිණුම් වලට බැර කළ යුතුය. සෑම මාසයකට ලෙජර ගිණුම් සමග සැපයුම් කරුවන් ගේ ගිණුම් සංසන්දනය කළ යුතු අතර වෙනසක් ඇතොත් ඒ පිළිබඳව කරුණු විමසා ඒවා ගැලපිය යුතු වේ. මෙසේ කිරීමෙන් ගෙවිය යුතු ණය පිළිබඳ ලේඛනයක් ලබා ගත හැකි වේ.

රජයේ ණය ශේෂ පත්‍රයෙහි එන දිනයේ දී රජයේ ණය ශේෂය සම්බන්ධයෙන් තහවුරු කෙරෙන සහතිකයක් භාණ්ඩාගාරයෙන් ලබා ගත හැකි විය.

ස්ථාවර වත්කම්

(අ) හරි වැරදි බැලීම—ආයතනයේ නීතිඥයන් වන ජූලියස් සහ ක්‍රිසි සමාගම තමන් ලඟ ආයතනයේ ඔප්පු ඇති බව දක්වමින් ලිපියක් එවා ඇත.

(ආ) බද්ද—පස්සර—අක්කරය රුපි. 500 ය බැගින් අක්කර 29 ක් පස්සර ගෝනකැලේ ප්‍රදේශයෙන් මිලදී ගැනීමට උත්සාහ කර ගෙන යන බව අප වෙත දන්වන ලදී. මෙම ඉඩම දැනට බද්දට ගෙන ඇත.

(ඇ) මොටෝ වාහන—ආයතනය සතු වාහනයන් හී ලියාපදිංචි සහතික පරීක්ෂා කිරීමෙන් එහි අයිතිය පිළිබඳව අපට සෑහීමට පත්විය හැකි විය.

(ඈ) නිවාස ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්—සමීක්ෂණ මණ්ඩලය මගින් සෑම වර්ෂයක් පාසාම නිවාස ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් ගැනලාම ගණන් බලනු ලැබේ. එතෙකුදු සාමාලෝචිත වර්ෂය තුල දී සමීක්ෂණ මණ්ඩලය විසින් මෙම කාර්යය ඉටුකොට නොමැත.

සමීක්ෂණ මණ්ඩලය සියලුම ස්ථාවර වත්කම් සම්බන්ධයෙන්ද, ගබඩාකරු ලඟ ඇති මෙන්ම විද්‍යාගාරවලත් ඇති තොග සම්බන්ධයෙන් ද ගණන් ගැනීමක් වාර්ෂිකව කළ යුතුම බවත්, ඔවුන්ගේ වාර්තාව ගණකාධිකාරීට හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂක වරයාට හෝ ඉදිරිපත් කළ යුතු බවත් අපි නිර්දේශ කරමු.

(ඉ) ස්ථාවර වත්කම් වලට කරන ලද එකතු කිරීම්—ස්ථාවර වත්කම් වලට කරන ලද එකතු කිරීම් වල වටිනාකම රුපි. 349,825/03 ක් විය. මෙයට සාන්ත ජොයකිම් සහ සාන්ත කුම්බ්ස් වතුයාය වල නැවත වගාකිරීම නිසා දෙපොලට එකතු වූ රුපි. 91,098/23 ක් ද ඇතුලත් විය. මෙම මුදල ප්‍රාග්ධන මය ස්වරූපයක් නොගන්න හෙයින් එය ප්‍රාග්ධනිත කළ නොයුතු බවත් අයභාර වැයට අය කළ යුතු බවත් අදහස් කරමු.

තරල පත්ල වියලන සංවර්ධන ගිනුම

ඉහත සඳහන් ව්‍යාපාරය සඳහා 1969 දෙසැම්බර් 31 වෙනි දිනට රුපි. 87,947/27 ක් වැය කොට ඇත. මෙම පරීක්ෂණාත්මක වියලනය ක්‍රියා කොට බැලීම සඳහා 1968 දී ආයතනය ජාතික පර්යේෂණ සංවර්ධන සංස්ථාවත්, ඇක්සියා පැන් සමාගමත් සමග ගිවිසුමකට බැඳිණ. මෙම ගිවිසුම අනුව සංස්ථාවද, සමාගමද සමග එකඟවන මිලකට මෙම වියලනය ආයතනය විසින් මිල දී ගැනීමට තීරණය කිරීමේ අයිතිය ආයතනය සතුය. මේ අතරතුර ඇක්සියා සමාගම වෙනත් සමාගමක් විසින් පවරාගෙන ඇති හෙයින් අලුත් සමාගම ගිවිසුම කෙළවර කිරීම සම්බන්ධයෙන් සංස්ථාවට දැනුම් දී ඇත. ඇක්සියා සමාගම මගින් එකඟ වූ රුපි. 71,375/46 ක මිලට 70.7.7 වෙනි දින මෙම වියලනය ආයතනය විසින් මිල දී ගන්නා ලද බව අපට දැනගන්නට ලැබිණ.

ආයෝජන

රුපි. 415,000 ක වටිනාකමක් ඇති රජයේ සුරැකුම් පත් පිළිබඳ ලියවිලි අප විසින් පරීක්ෂා කරන ලදී. එක්සත් රාජධානියේ සුරැකුම් පත් පිළිබඳ ලියවිලි තමන් සතුව

ඇති බැවි ලංඩනයේ ප්‍රංශ දෙව් මැදුර වීදියේ අංක 23 දරණ ස්ථානයේ නැෂනල් සහ ග්‍රින්ලේස් බැංකුව ස්ථිර කොට ඇත. මෙම සුරැකුම් පත්වල වටිනාකම රුපි. 362/82 ක් විය. 1969 දෙසැම්බර් 31 වෙනි දිනට ආයෝජනයන් ගේ මුළු වෙළෙඳ වටිනාකම 433,729/50 ක් වූ අතර පොත් වල පෙනෙන මෙම ශේෂයන් ගේ වටිනාකමට වඩා එය අඩු විය. පොත් වල ශේෂය රුපි. 43,633/31 කි.

මෙම ආයෝජනය පිළිබඳ සියලුම ලියවිලි ආයතනයේ බැංකුකරුවන් වෙත තැබිය යුතු අතර සෑම අවුරුද්දකම සම්පූර්ණ ආයෝජණ පිළිබඳ ස්ථිර කිරීමක් විගණිතවරුන් වෙත යවන ලෙස නියම කළ යුතු ද වේ.

## තොග

ආයතනය සතුව තිබූ තොග පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් (තුන්වන උපලේඛනය) මෙම වාර්තාවට යාකොට ඇත.

### (අ) ගැණලාම හරි වැරදි බැලීමේදී ඇතිවෙන වෙනස

තොග වාර්තා හා 1969 දෙසැම්බර් 31 වෙනි දින කරණ ලද තොග ගැනලාම හරි වැරදි බැලීම අතර පහත පෙනෙන වෙනස්කම් විද්‍යාමාන විය. මෙම වෙනස ඉතා අල්ප බැවින් ගිණුම්වල අප විසින් මේ වෙනස ගලපන ලදි.

| | වැඩි | අඩු |
|---|---|---|
| පොදු භාණ්ඩ ... ... ... | — | 160.38 |
| විදුලි භාණ්ඩ ... ... ... | 39.25 | — |

තොග ගැනලාම හරි වැරදි බැලීමේ දී එම ප්‍රතිඵල තොග පත්‍ර හා සසඳා බලන බවක් නොපෙනේ. මෙලෙස ගැනලාම හරි වැරදි බලන කළ එය කාර්යාල තොග පත්‍ර හා සසඳා බැලිය යුතු බවත් ඒවා කෙටිසන් කොට වෙනෙසක් ඇත්නම් විමසා බැලිය යුතුම බවත් අපි අවධාරණයෙන් සඳහන් කරමු. මෙය සමීක්ෂණ මණ්ඩලය විසින් කළ යුතු කාර්යයකි.

### (ආ) නැවත පිරවූ ටයර් සහ මොටෝ අමතර කොටස්

නැවත පිරවූ ටයර් සහ මොටෝ අමතර කොටස් සඳහා තොග පාලන ගිණුමක් තබා ගන්නා ලෙස අපි යෝජනා කරමු. මොටෝ අමතර කොටස් හා නැවත පිරවූ ටයර් එහා මෙහා යැම දක්වෙන පොත විගණනය සඳහා පිළිගත නොහැකි විය.

### (ඇ) තොග එහා මෙහා යැම

සමහර තොග බොහෝ කලක සිට භාවිතා නොවන බවත් සමහර තොග ස්වල්ප වශයෙන් එහා මෙහා යැවෙන බවත් අප විසින් නිරීක්ෂණය කරන ලදී. සමහර තෙල් සහ ග්‍රීස් තොග අවුරුදු 6 කටත් වැඩි කාලයක් භාවිතා නොවිණ. සමහර ටින් බෙහෙවින් මලකා ඇත. තවත් සමහරක් ටින් දිරායෑම නිසා තෙල් කාන්දු වීමට ඉඩ තිබේ. මෙ ලෙස නොසෙල්වන තොග ඉවත් කිරීමට ප්‍රමාද නොවී පියවර ගත යුතුය. ඒ හැරත් මෙලෙස නොසෙල්වෙන භාණ්ඩ වෙනම කාමරයක තැබීමට පියවර ගත යුතුය. මේ සඳහා වෙනම තොග පත්‍ර තබා ගත හැකිය.

### (ඇ) තොග පාලනය

සෑම දෙපාර්තමේන්තු ප්‍රධානියකුම තම දෙපාර්තමේන්තුවට වර්ෂයකට වුවමනා කරණ අඩුම තොග ප්‍රමාණයද, දෙපාර්තමේන්තුව සතුව තබා ගත යුතු අඩුම ප්‍රමාණයද තීරණය කළ යුතුය. මෙම ප්‍රමාණය තබා ගනු ලබන්නේ නම් ඉතා හෙමින් දිවෙන හා නොදිවෙන තොග තබා ගැනීම අඩුකළ හැකිය.

(ඉ) රසායනික

1969 දෙසැම්බර් 31 වෙනි දිනට විද්‍යාඥයන් ලඟ තිබූ රසායනික ද්‍රව්‍ය ගණන් බලා අගය බලා ගිණුම් වලට ඇතුලත් නොකොට තිබුණි. මෙම පිළිවෙත පිළිගනු ලබන්නේ නම් මෙසේ තබා ගැනීම වරදක් නොවේ. එහෙත් ප්‍රමාණුකූල සංඛ්‍යා තබා ගත යුතුවේ.

(ඊ) පස්සර ඇති තොග

70.7.28 වෙනි දින පස්සර ඇති තොග පිළිබඳව හදිසියේ පරීක්ෂණයක් පැවැත් වූ අතර පහත දැක්වෙන පරිදි භාණ්ඩ අඩුවීම හා අමතරව තිබීම විද්‍යාමාන විය.

| | පොත් ශේෂය | ගැණලාම බැලීම | වැඩි | අඩු. |
|---|---|---|---|---|
| කැල්සියම් ඇමෝනියම් නයිට්රේට් | රාත්. 328 | රාත්. 1954 | — | — |
| සල්ෆේට් ඔෆ් ඇමෝනියම් | රාත්. 1187 | රාත්. 175 | — | — |
| සුපොස් පොස්පේට් | රාත්. 513 | රාත්. 360 | — | රාත්. 153 |
| මියුරේට් පොටෑෂ් | රාත්. 777 | රාත්. 160 | — | රාත්. 617 |

මෙම අඩු වීම පිළිබඳව ඌව විද්‍යා නිලධාරිට දන්වන ලදී. භාණ්ඩ අඩු බව ඔහු පිළිගත් අතර තොග සඳහා ඇති ඉඩ අප්‍රමාණවත් වන හෙයින් මෙය සිදු වී යැයි ඔහු පැවසීය. තොග සඳහා සථානයක් නොවූ අතර මේ පෝර දෙරවල් නැති විවෘත මඩුවක තැන්පත් කොට තබන ලදි.

(උ) හන්තාන සහ පස්සර ඇති තොග ශේෂය ගිණුම් වලට ඇතුලත් කොට නො මැත.

ස්ථිර තැන්පත් රුපි. 1,000,000—මෙම ශේෂ පත්‍රයේ දිනට ආයතනයට හිමි විය යුතු ශේෂය තහවුරු කෙරෙන සහතිකයක් අපට දැක හැකි විය.

ණය කරුවන් සහ ණය ශේෂය—ණය කරුවන් සහ ණය ශේෂය දැක්වෙන ප්‍රකාශයක් (පස්වන උපලේඛනය) මෙම වාර්තාවට ඇතුලත් කොට ඇත.

(අ) 1969 දෙසැම්බර් 31 වෙනි දිනට අය විය යුතුව තිබුණු රුපි. 734,990/79 ක ශේෂය පසුගිය වසරේ ප්‍රමාණයට වඩා රුපි. 993,785/56 කින් අඩු විය. මෙය බෙහෙවින්ම හේතු වූයෙන් නියම වේලාවට සෙස් බද්ද එකතු කර ගත් නිසාය.

(ආ) අනෙක් ණය කරුවෝ—රුපි. 9,132/62 මෙම ගිණුම සඳහා නිසි ලෙජරයක් පවත්වා ගෙන යනු නොලැබේ. දැනට පවත්වා ගෙන යනු ලබන පොත ද්විසටහන් ක්‍රමයෙන් කොටසක් නොවේ. ණය කරුවන් සඳහා වෙනම ලෙජරයක් පවත්වා ගෙන යා යුතු බවත් එය සෑම මසක් අවසානයේම ගැලපිය යුතු බවත් මෙලෙස කිරීමෙන් අභ්‍යන්තර පාලනය ශක්තිමත් වන බවත් අය කර ගැනීම පහසු වන බවත් අපි අදහස් කරමු.

